**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

# කාර්යසාධන වාර්තාව
# 2012

©2013 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**
**මහලේකම් කාර්යාලය (3 වැනි මහල)**
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

info@erd.gov.lk
http://www.erd.gov.lk/publication.html

# අන්තර්ගතය


## සමස්ත විග්‍රහය පි1

## සංවිධාන ව්‍යුහය පි2

කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය සහ පුහුණු කිරීම

## විදේශ මූල්‍යයනය පි4

විදේශ මූල්‍යයන එකඟතා
විදේශ මූල්‍යයන උපයෝජනය
පළ කරන ලද එකඟතාවයන් මත ඉදිරියට උපයෝජනය වීමට නියමිත ශේෂය
විදේශ මූල්‍යයන්ගේ උපයෝජන අනුපාතය
විදේශ ණය තොගය සහ විදේශ ණය සේවාකරණය

## එක් එක් අංශයන්හි කාර්ය සාධනය

### ආසියානු සංවර්ධන බැංකු අංශය පි8

ආසියානු සංවර්ධන බැංකුව සමඟ වන සංවර්ධන පාර්ශ්වකාරීත්වය
දේශීය සහභාගීත්ව උපාය මාර්ග CP 2013-2015
2012 වර්ෂයේ එකඟතා හා උපයෝජනයන්
2012 වසරේ ආසියානු සංවර්ධන බැංකු ණය වත්කම්
2012 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති
2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත වූ ප්‍රධාන ව්‍යාපෘති
2012 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති
2012 විශේෂ අවස්ථා

# අන්තර්ගතය *ඉතිරිය...*

**ජපාන අංශය** පි 11

- ආංශික වශයෙන් ආයෝජන විශ්ලේෂණය
- 2012 වසරේ ඒකඟතාවන්
- 2012 වසරේ උපයෝජනයන්
- 2012 වසරේ ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රමුඛ ව්‍යාපෘතීන්
- 2013 වසරේ දී ක්‍රියාත්මක ව්‍යාපෘතීන්
- 2012 වසරේදී සිදු වූ සුවිශේෂී කාර්යයන්

**ලෝක බැංකු අංශය** පි 16

- 2012 වසරේ ඒකඟතාවන්
- 2012 වසරේ උපයෝජනයන්
- විශේෂ අවස්ථා සහ ලෝක බැංකු දූත මණ්ඩල

**මැදපෙරදිග හා සාක් කලාපය** පි 18

- **මැදපෙරදිග කලාපයේ රටවල්**
  - 2012 වසරේ ඒකඟතාවන්
  - 2007 - 2012 කාලය තුළ එළඹි ඒකඟතා
  - 2012 ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති
  - 2012 වසරේ උපයෝජනයන්
  - උපයෝජනය 2007 - 2012

- **සාර්ක් කලාපයේ රටවල්**
  - **ඉන්දියාව**
    - 2012 වසරේ ඒකඟතාවන්
    - ආංශීය ඒකඟතා 2008-2012
    - 2012 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති
    - 2012 තුළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ඇති වූ අවබෝධතා ගිවිසුම්

**ද්විපාර්ශ්වීය නැගෙනහිර අංශය** පි 24

- **චීනය**
  - ආංශික ව්‍යාප්තිය

- **කොරියාව**
  - 2012 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති
  - 2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත වූ ප්‍රධාන ව්‍යාපෘති

# අන්තර්ගතය *ඉතිරිය...*


*ද්විපාර්ශ්වීය බටහිර අංශය* පි27
2012 වසරේ මුල්‍යමය එකඟතා
2012 වසරේදී සම්මුති සාකච්ඡා නිමකරන ලද ප්‍රධාන ව්‍යාපෘති
2012 වසර තුළ ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති

**මානව සම්පත් සංවර්ධන සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන අංශය** පි30

**එක්සත් ජාතීන්ගේ සංවිධාන අංශය** පි30
2012 වසරේ එකඟතා
2012 වසරේ උපයෝජනයන්
2012 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති
2012 වසරේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් පිළිබඳ සංක්ෂිප්ත සටහන්
2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත මිලියන ව්‍යාපෘති
එක්සත් ජාතීන්ගේ මාර්ගගත ස්වේච්ඡා සේවා
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD)
2012 විශේෂ අවස්ථා

**මානව සම්පත් සංවර්ධන** පි34
කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ලබා දුන් කණ්ඩායම් පුහුණු පාඨමාලාවන්
ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ලබා දුන් කණ්ඩායම් පුහුණු පාඨමාලාවන්

**ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශය** පි37
ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශයේ කාර්යභාරය
2011 වසරේ කාර්යසාධන

**මූල්‍ය විග්‍රහය** පි38
**වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු**
**අත්තිකාරම් ගිණුම්**
**විගණන විමසුම්**
**විසර්ජන ගිණුම**

**ඇමුණුම්** පි I-V

# දැක්ම

ඉහළ මධ්‍යම ආදායම් මට්ටමට ශ්‍රී ලංකාව ළඟා වීමේදී අවශ්‍ය වන
ආර්ථික වර්ධනය උදෙසා විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම
හා කළමනාකරණයට උචිත දැනුමෙන් හා නිපුණත්වයෙන්
මනාව පරිපූර්ණ වීම

# මෙහෙවර

රටේ දිගුකාලීන ණය පිළිබඳ තිරසාරභාවය පවත්වාගෙන යමින්
"මහින්ද චින්තන - නව ශ්‍රී ලංකාවක් සඳහා ඉදිරි දැක්ම"
යන තේමාව හා අනුගත වන පරිදි අවම පිරිවැයක් දරා
විදේශ මූල්‍ය ඒකරාශී කිරීම

# අරමුණු

- රජයේ දස අවුරුදු සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති, හිතකර කොන්දේසි හා නියමයන් මත අවම පිරිවැයකින් හා අඩු අවදානමකින් යුතුව මූල්‍යයනය කිරීමට විදේශ මූල්‍ය සම්පත් ඒකරාශී කිරීම
- විදේශ සම්පත් ඵලදායී අන්දමින් හා කාර්යක්ෂම ලෙස වැයයෝජනය කිරීමට පහසු කිරීම
- දිගුකාලීන විදේශ ණය තිරසාර භාවයෙන් පවත්වාගෙන යෑමෙහිලා දායකවීම
- විදේශ පුහුණු අවස්ථා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම තුළින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායක වීම
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී ලෙස මෙන්ම සාර්ථක ලෙස ඉටු කිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් තවදුරටත් සවිමත් කිරීම

# අපේ සාරධර්ම

සියලුම අණ පනත්වලට අවනත වෙමින් හෘද සාක්ෂියට අනුකූලව
කටයුතු කිරීම, ඉතා උසස් මට්ටමේ යහපාලනය,
විනිවිදභාවය හා අනාවරණය පිළිබඳ ප්‍රතිපත්තීන්
පිළිපදිමින් ආචාරශීලීව කටයුතු කිරීම

උසස් මට්ටමේ පුද්ගල එකමුතුභාවයට අනුකූලතාවයන් දක්වමින්
පෞද්ගලික අභිලාෂයන්ට වඩා දෙපාර්තමේන්තුවේ
අභිලාෂයන්ට ප්‍රමුඛස්ථානය දීම

කාර්ය මණ්ඩලයට ස්වකීය උපරිම කාර්ය සාධන මට්ටම කරා ළඟා
වීමට හැකිවන පරිදි සහ එම කාර්ය ප්‍රදර්ශනය කිරීමට හැකිවන
ලෙස අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා විශ්වාසයෙන් කටයුතු
කළ හැකි පරිසරයක් බිහි කිරීම

සත්‍ය හා සාධාරණවූත්, ගණුදෙනු තුළින් සංවර්ධනය කෙරෙහි
උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් සමඟ දිගුකාලීන
යහපත් සබඳතා ප්‍රවර්ධනය කිරීම

සෑම මට්ටමකම කාර්ය මණ්ඩල සවිබලකරණය හා ඔවුන්ගේ
කටයුතුවලට මැදිහත්වීම අවම කිරීම තුළින් ස්වකීය
රාජකාරි සම්බන්ධව වගකිව යුතු
බව ඒත්තු ගැන්වීම

# සමස්ත විග්‍රහය

මහින්ද චින්තන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මඟින් අපේක්ෂා කරන ලද පරිදි රටතුල සීඝ්‍ර සංවර්ධනයක් අත් කර ගැනීම සඳහා විධිමත් ලෙස සංවර්ධනය වු සමාජයීය සහ ආර්ථික යටිතල පහසුකම් ජාලයක අවශ්‍යතාවය මනාව හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2005 වසරේ සිට යටිතල පහසුකම් සංවර්ධනය රජයේ ප්‍රමුඛතාවයක් බවට පත්වී ඇත.  ඒ අනුව, මහාමාර්ග, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති, වරාය, ගුවන්, දුම්රිය, වාරිමාර්ග, ජල, සනීපාරක්ෂක සහ නාගරික සංවර්ධනය යන ආර්ථිකයේ සියලුම උප අංශ ආවරණය වන පරිදි විශාල ආයෝජනයන් සිදු කළ යුතු වේ. එමෙන්ම සුළු වාරිමාර්ග, ප්‍රවේශ මාර්ග, ප්‍රජා ජල සම්පාදන, වෙළඳපොළ, පාසල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ ග්‍රාමීය විදුලිබල වැනි කුඩා පරිමාණ බහුවිධ යටිතල පහසුකම් සම්පාදනය ග්‍රාම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගයන්ගේ මූලික අරමුණ වේ.

2009 වසරේදී ගැටුම් නිමාවට පත්වීමත් සමඟ එම ප්‍රදේශවල යටිතල පහසුකම් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම, බිම්බෝම්බ ඉවත් කිරීම සහ නැවත පදිංචි කිරීම, ගැටුම් හේතුවෙන් පීඩාවට පත් වූ ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු වේගවත් කිරීම උදෙසා සිවිල් පරිපාලනය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ මනාව ඒකාබද්ධ වූ ජාතික සංවර්ධනයක් ඇති කිරීම රජයේ සංවර්ධනය උපාය මාර්ගයන්හි ප්‍රධාන අංගයන් බවට පත්වී ඇත.

2005 වසරට පසුකාලීන විදේශ මූල්‍යයන සහයෝගීතාවයේදී බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් ලෙස ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර අරමුදල වැනි ආයතනයන් ද්විපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් ලෙස ජපානය, ඉන්දියාව, චීනය, කොරියාව, බටහිර රාජ්‍යයන් සහ මැද පෙරදිග රාජ්‍යයන් ද සුවිශේෂි දායකත්වයක් දක්වා ඇත.

මේ අනුව, ආදායම් ගිණුමේ වර්ධනයන් තුළින් අයවැය හිඟය තවදුරටත් අවම කිරීම සඳහා මූල්‍ය ප්‍රතිසංස්කරණය වඩාත් තහවුරු කරන අතරම පවත්නා මූල්‍ය සීමාවන් තුළ රැදෙමින් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6ත් 7ත් අතර වූ මට්ටමක රාජ්‍ය ආයෝජන පවත්වා ගෙන යාමට රජය කැපවී සිටී.  සීමාසහිත වූ දේශීය සම්පත් සහ විශාල පරිමාණ රාජ්‍ය ආයෝජනයන් හා බැදුණු ගෙවුම් ශේෂ අභියෝගයන් මධ්‍යයේ රටට අවශ්‍ය සංවර්ධන වියදම් දීර්ඝ කාලීන විදේශ මූල්‍යයනය ඒකඟතාවයන් තුළින් මූල්‍යයනය කිරීම සඳහා රජය යොමු වී ඇත.

ශ්‍රී ලංකාව මැදි ආදායම් ආර්ථිකයක් ලෙස තහවුරුවීමත් පසුගිය දශක දෙක තුළ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා දියුණු ආර්ථිකයන් විසින් දියුණුවන රටවල් සඳහා ලබා දුන් නිල සංවර්ධනය සහායන් ක්‍රමිකව අඩුවීමත් හේතුවෙන් මෙරටේ සංවර්ධන කටයුතු සඳහා ලැබුණු සහනදායි ණය සහ ප්‍රදානයන්හි ක්‍රමික අඩු වීමක් සිදු වී ඇත.

මෙම පසුබිම යටතේ, ණය සේවාකරණය, ගෙවුම් ශේෂ අනුමිතීන් හා විදේශ මූල්‍යයන ඒකඟතාවයන්හි කල්පිරීමේ ව්‍යුහයන් සලකා බලා වඩා උචිත ව්‍යාපෘති මූල්‍යකරණ ආකෘතීන් සැකසීමට රජය විසින් කටයුතු කොට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, පුද්ගලික අංශයේ ආයෝජන ඉඩ ප්‍රස්ථා පුළුල් කරනු ලබන සහ අපනයන භාණ්ඩ හා සේවා උත්පාදනය කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා දීර්ඝ කාලීන ණය උපයෝජනය කිරීම කෙරෙහි රජය ක්‍රමිකව යොමු වී ඇත.

විවිධාංගීකරණය වී ඇති ණය කොන්දේසි සහ නියමනයන්ට අවධානය යොමු කරමින් ණය ගැනීම්වල සමස්ත පිරිවැය දැරිය හැකි මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය මූලාශ්‍රයන්ගෙන් ලැබෙන සහනදායී මූල්‍යයනයන් සහ මූල්‍ය වෙළඳපොළෙන් ලබා ගන්නා සහනදායී නොවන මූල්‍ය පහසුකම්වල මනා සංකලනයක් පවත්වාගෙන යාමට රජය සමත්වී ඇත.

එසේ ලබා ගන්නා මූල්‍යයනයන් භාණ්ඩ හා සේවා අපනයන ප්‍රවර්ධනය කිරීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආදායම් වැඩිකිරීම සහ සංචාරක ක්ෂේත්‍රයේ විදේශ විනිමය ඉපැයීම් වර්ධනය කර ගැනීම සඳහා තුඩු දෙන ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙන්ම සුවිශේෂි බැර කර්මාන්ත (Heavy Industries), ආහාර, පශු සම්පත්, සීනි, සැහැල්ලු ඉංජිනේරු, ඖෂධ, රෙදිපිළි, පුනර්ජනනීය බලශක්ති වැනි අපනයන ආදේශන ක්‍රියාමාර්ගයන්හි ද  රජය විසින් උපයෝජනය කර ඇත. එවැනි අනුපූරකයන්ගේ මෙන්ම දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනය හේතුවෙන් 2002 වසරේ සියයට 56.3ක් වූ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ විදේශ ණය ප්‍රතිශතය 2012 වසර වනවිට සියයට 47.8 දක්වා අඩු වී ඇත.

රාජ්‍ය ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විදේශ මූල්‍යයනයන් උපයෝජනය කර ගැනිමට අමතරව ඒ සඳහා භාවිතා කළ හැකි දේශීය මූල්‍යයන පදනම වඩාත් පුළුල් කිරීම සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ගෙන ඇත. බැංකු මඟින් සිදු කරන බදු ඉතුරුම් දීර්ඝ කාලීන ණය පහසුකම් සැපයීම සඳහා යොදා ගැනීමේ පරමාර්ථයෙන් 2011 වසරේ අයවැය මඟින් යෝජනා කළ පරිදි වාණිජ බැංකුවල ආයෝජන අරමුදල් ගිණුම් අරඹා ඇති අතර එමඟින් රජය යටතේ පාලනය වන රාජ්‍ය ව්‍යාපාර සහ සංස්ථාවල සංවර්ධනය මූල්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මනා ප්‍රවේශය ලබා දේ.

ආසියානු සහ අප්‍රිකානු රටවල සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය විසින් ශිල්පීය ආධාර සහ ප්‍රදාන ලබාදී ඇත. ශිල්පීය ආධාර ලබාදීම තුළින් සහ වෘත්තීය පුහුණු, දිළිඳුකම පිටුදැකීම, ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීම, අධ්‍යාපනය, සෞඛ්‍ය, වාරිමාර්ග, ඉදිකිරීම් කටයුතු, බැංකු කටයුතු සහ ගිණුම්කරණසේවා යන ක්ෂේත්‍රයන්ට අදාළ අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතනයන්හි පවතින විශේෂඥ දැනුම උපයෝජනය කරමින් කුඩා පරිමාණ ව්‍යාපෘති මූල්‍යයනය කිරීම මඟින් මිත්‍ර රාජ්‍යයන් සමඟ පවත්නා ආර්ථික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් මේ වන විටත් ගෙන ඇත.

# සංවිධාන ව්‍යුහය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයකුගෙන් සහ අධ්‍යක්ෂවරු හය දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂවරුන් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ලබන අතර, එම අංශයන් පහත සඳහන් පරිදි වේ.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- ලෝක බැංකු අංශය
- ජපාන අංශය
- ද්විපාර්ශ්වික බටහිර අංශය
- ද්විපාර්ශ්වික නැගෙනහිර අංශය
- මැද පෙරදිග හා දකුණු ආසියානු අංශය
- මානව සම්පත් සංවර්ධන හා එක්සත් ජාතීන්ගේ සංවිධාන අංශය
- ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශය
- පරිපාලන හා ගිණුම් අංශය

2012 දෙසැම්බර් මස 31 වන දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යා තොරතුරු පහත දැක්වේ.

සේවක සංඛ්‍යා තොරතුරු - 2012.12.31 දිනට

| සේවක ගණය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 48 | 31 | 17 |
| සහායක නිලධාරීන් | 64 | 40 | 24 |
| කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | 29 | 24 | 05 |
| **එකතුව** | **141** | **95** | **46** |

පරිපාලන හා ගිණුම් අංශයන්, දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහායක සේවා සපයනු ලැබේ. එම සහායක සේවාවන් යනු භෞතික හා මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය වේ. සේවාවන් සම්බන්ධ භෞතික සම්පත් සැපයීම කළමනාකරණය කිරීම හා නඩත්තුවත්, භාණ්ඩ සමීක්ෂණය පවත්වා භෞතික සම්පත් ලේඛනගත කිරීමත් 2012 වර්ෂය සඳහා සම්පූර්ණ කර ඇත.

2012 වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 32ක ප්‍රතිශතයක් පුරප්පාඩුව පැවති බව ඉහත වගුවෙහි පෙන්නුම් කරයි. 2012 වාර්ෂික කාර්ය සැලැස්මෙහි සදහන් වූ ඉලක්කයන් ලඟාකර ගැනීමේදී එය අභියෝගයක්ව පැවතුනි.

# කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය සහ පුහුණු කිරීම

මානව සම්පත් සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව 2012 වර්ෂයේදී විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදී. දේශීය හා විදේශීය පුහුණු අවස්ථා රාශියක් ලබාදීම මගින් දෙපාර්තමේන්තුවේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ සහ සහායක සේවාවන්ට අයත් නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන වීම සඳහා කටයුතු කරන ලදී. ආයතනයේ නිලධාරීන්ට 2012 වර්ෂය තුලදී ලබාදෙන ලද දේශීය පුහුණු ක්ෂේත්‍රයන් සහ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

**විධායක ශ්‍රේණියේ නිලධාරීන් ලැබූ දේශීය හා විදේශීය පුහුණු**

| පුහුණු වැඩසටහන | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| නිල සංවර්ධන සහාය ඇගයීමේ වැඩමුළුව | 1 |
| විදේශ දූත කණ්ඩායම් පුහුණු කිරීමට අදාළ පොදුරාජ්‍ය මණ්ඩලීය කලාපීය වැඩසටහන | 1 |
| කාන්තා හා ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 |
| ජපාන නිල සංවර්ධන සහාය ණය ව්‍යාපෘති ඇගයීම පිළිබඳ වැඩමුළුව | 1 |

දෙපාර්තමේන්තුවේ පරිපාලනය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් 2012 වර්ෂයේදී දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීමට කටයුතු කරන ලදී. ඔවුන් පුහුණුව ලැබූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි වේ.

**සහායක කාර්ය මණ්ඩලය ලැබූ දේශීය පුහුණු**

| පුහුණුව ලැබූ ක්ෂේත්‍ර | පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය |
|---|---|
| ඉංග්‍රීසි භාෂාව | 1 |
| කාර්යාල කළමනාකරණය | 8 |
| යහ පාලනය සහ මානව සම්පත් කළමනාකරණය | 2 |
| ගබඩාකරණය | 3 |
| කාර්යාල සේවක සේවයේ පුහුණුව | 14 |
| රියදුරු කාර්ය සාධනය | 3 |
| Payroll වැඩසටහන - 2012 | 1 |
| ලිඛිත සන්නිවේදනය | 7 |
| වැටුප් පරිවර්තන පිළිබඳ පාඨමාලාව | 1 |
| ප්‍රවාහන කළමනාකරණය | 1 |

# විදේශ මූල්‍යයනය

රටේ රාජ්‍ය ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විදේශ අරමුදල් ඒකරාශී කිරීම සඳහා රජයට සහාය වීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වේ. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් ශ්‍රී ලංකා රජය එක් එක් රටවල් හා විදේශ ආයතන සමග 2012 වර්ෂයට අදාළව ඇති කරගත් එකඟතා, එම අරමුදල්වල උපයෝජනය හා ණය සේවාකරණය පිළිබඳ සාරාංශයක් මෙම පරිච්ඡේදයේ දැක්වේ.

## විදේශ මූල්‍යයන එකඟතා

මෙරට ලැබී ඇති විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණය 2006-2012 කාල පරිච්ඡේදය තුළ වාර්ෂිකව සියයට 19ක ප්‍රතිශතයකින් ක්‍රමිකව ඉහළ ගොස් ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ඇතිකර ගත් මූල්‍ය එකඟතාවලින් වැඩි ප්‍රමාණයක් මාර්ග, අධිවේගී මාර්ග, පාලම්, විදුලිබල, වරාය, ගුවන්තොටුපොළ, ජල සම්පාදන, වාරිමාර්ග සහ දුම්රිය මාර්ග සංවර්ධනය ඇතුළු ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගෙන ඇත. සුවිශේෂි වැදගත් කමකින් යුත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ මූල්‍යයන එකඟතා රාශියක් 2010 වර්ෂයේ දී ඇතිකරගත් බැවින් 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී මූල්‍යයන එකඟතා ප්‍රමාණය සුළු වශයෙන් පහළ ගියද නැවත 2012 වර්ෂයේදී එම විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණය ඉහළ ගොස් ඇත.

සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන නියෝජිතායතන සමඟ 2012 වර්ෂය තුළ ඇතිකර ගත් විදේශ මූල්‍යයන එකඟතාවන්හී මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 3,152කි. ඉන් ඇ.ඩො. මිලියන 2,789ක් ව්‍යාපෘති ණය වූ අතර ඉතිරි ඇ.ඩො. මිලියන 363 ආපසු නොගෙවන ප්‍රදාන විය. 2012 වර්ෂය තුළ ඇති කරගත් සමස්ත විදේශ මූල්‍යයන එකඟතා ප්‍රමාණයෙන් සියයට 33ක් චීනය සමඟ ඇති කරගත් එකඟතා වූ අතර තවත් සියයට 22ක් ඉන්දියාව සමඟද, සියයට 17ක් ජපානය සමඟද, සියයට 11ක් ලෝක බැංකුව සමඟද, සියයට 3ක් ආසියානු සංවර්ධන බැංකුව හා නෙදර්ලන්තය සමඟද ඇතිකරගත් එකඟතා වූ අතර ඉතිරි සියයට 14 අනෙකුත් සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණයදෙන නියෝජිතායතන සමඟ ඇතිකරගත් මූල්‍යයන එකඟතා වේ.

විදේශ මූල්‍යයන එකඟතා එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව - 2012 (ඇ.ඩො. මිලියන)

| සංවර්ධන පාර්ශ්වකරු | ණය | ප්‍රදාන | එකතුව |
|---|---|---|---|
| **ද්විපාර්ශ්වීය** | **2,302.47** | **283.04** | **2,585.51** |
| චීනය* | 1,056.05 | 0.16 | 1,056.21 |
| ප්‍රංශය | 28.29 | - | 28.29 |
| ජර්මනිය | 34.42 | 5.27 | 39.69 |
| ඉන්දියාව | 443.06 | 257.28 | 700.34 |
| ජපානය ** | 508.74 | 15.23 | 523.97 |
| කොරියාව | 11.13 | - | 11.13 |
| නෙදර්ලන්තය | 102.50 | - | 102.50 |
| සෞදි අරාබිය | 60.00 | - | 60.00 |
| ස්පාඤ්ඤය | 14.14 | - | 14.14 |
| ඇමරිකා එක්සත් ජනපදය | - | 5.10 | 5.10 |
| එක්සත් රාජධානිය | 44.14 | - | 44.14 |
| **බහුපාර්ශ්වීය** | **486.53** | **80.97** | **567.50** |
| ආසියානු සංවර්ධන බැංකුව | 99.68 | - | 99.68 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල | 22.03 | - | 22.03 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 40.00 | - | 40.00 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | - | 68.98 | 68.98 |
| ලෝක බැංකුව | 324.82 | 10.49 | 335.31 |
| **එකතුව** | **2,789.00** | **362.51** | **3,151.51** |

** ස්වෛරීත්ව ඇපකර මත ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබා දුන් ණය ඇතුලුව*

*** ස්වෛරීත්ව ඇපකර මත ගුවන්තොටුපොළ හා ගුවන් සේවා සමාගම සඳහා ලබාගත් ණය ඇතුලුව*

## විදේශ මූල්‍යයන උපයෝජනය

ව්‍යාපෘති හරහා සිදු වූ මුළු උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,986ක් වූ අතර, එයින් සියයට 92ක් එනම් ඇ.ඩො. මිලියන 1,835ක්, ණය මත ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතීන්ගේ උපයෝජනයන් වූ අතර ඉතිරි සියයට 8 එනම් ඇ.ඩො. මිලියන 151ක් ප්‍රදාන මත ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතීන්ගේ උපයෝජනයන් විය.

2012 වර්ෂයේ සිදු වූ මුළු උපයෝජනයන්ගෙන් සියයට 24ක් එනම් ඇ.ඩො. මිලියන 484ක් චීනය විසින් මූල්‍යයනය කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි උපයෝජනය විය. මෙම අරමුදල් ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය, උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති සඳහා යෙදවිණි. සමස්ත උපයෝජනයන්ගෙන් සියයට 19ක් එනම් ඇ.ඩො. මිලියන 396ක් ජපානය විසින් මූල්‍යයනය කරන ලද මහකොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන 72) හා ඉහළ කොත්මලේ ජලවිදුලි ව්‍යාපෘතිය (ඇ.ඩො. මිලියන 67) යන ව්‍යාපෘතීන්හි උපයෝජනය විය. ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතීන්හි සිදු වූ උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 302කි. (එනම් මුළු උපයෝජන ප්‍රමාණයෙන් සියයට 15කි) ඒවා ප්‍රධාන වශයෙන්, කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, පිවිතුරු බලශක්තිය හා ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල උපයෝජනය විය. ඉන්දියාව, ලෝක බැංකුව හා වෙනත් සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතීන් හරහා පිළිවෙලින් මුළු එකඟතාවයන්ගෙන් සියයට 14.8 සහ 20ක් ලෙස උපයෝජනය විය.

## පළ කරන ලද එකඟතාවයන් මත ඉදිරියට උපයෝජනය වීමට නියමිත ශේෂය

එකඟතාවය පළ කරන ලද එහෙත් තවමත් සංවර්ධන ව්‍යාපෘතීන්හි හා විවිධ වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ප්‍රමාණය, 2012 වර්ෂය අවසාන වනවිට ඇ.ඩො. මිලියන 7.145ක් විය. මෙයින්, සියයට 20ක් එනම් ඇ.ඩො. මිලියන 1,395ක් ජපානය විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතීන්හි උපයෝජනය වීමට නියමිත වන අතර සියයට 18ක් එනම් ඇ.ඩො. මිලියන 1,291ක් චීනය විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතීන්හි ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟතාව පළ කරන ලදුව ඉදිරියට උපයෝජනය වීමට නියමිත ප්‍රමාණය ඇ.ඩො.මිලියන 1,065ක් (සමස්ත උපයෝජනයෙන් සියයට 15) වන අතර ඉන්දියාව හා ලෝක බැංකුව විසින් එකඟතාවය පළ කරන ලදුව උපයොජනය කිරීමට නියමිත ප්‍රමාණය පිළිවෙලින් ඇ.ඩො.මිලියන 873ක් (සියයට 12) හා ඇ.ඩො.මිලියන 676ක් (සියයට 9) වේ.

## විදේශ මූල්‍යයන්ගේ උපයෝජන අනුපාතය

ව්‍යාපෘති නිම කිරීමේ සාමාන්‍ය කාලය වසර 4-5 වන්නේ නම් සහ උපයෝජන අනුපාතය සියයට 20-25 අතර ප්‍රමාණයක පවතී නම් පිළිගත් නිර්ණායක අනුව එය සතුටුදායක මට්ටමක් වේ. ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීම, විධිමත් මූල්‍ය ප්‍රවාහ සැකසීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍යයනය හා ඒ සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන් ලබාදෙන මූල්‍යයනයන් අතර රික්තය පිරිවීම සඳහා විදේශ මූල්‍ය වෙළඳපොළ මඟින් ලබාගත් ණය භාවිතා කිරීම, අය වැය කළමනාකරණය සඳහා වූ සාධනීය භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් රජය හා ඒ ඒ සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් පසුගිය වසර 5ක කාලය තුළ ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම හේතුවෙන් පසුගිය වසර 5ක කාලයක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල උපයෝජන අනුපාතයේ ක්‍රමික වර්ධනයක් ඇති විය.

උපයෝජන අනුපාත 2012

| සංවර්ධන පාර්ශ්වකරු | උපයෝජන අනුපාතය % |
|---|---|
| **ද්විපාර්ශ්වීය** | **21.30** |
| ජපානය | 20.37 |
| චීනය | 22.62 |
| ඉන්දියාව | 25.48 |
| නෙදර්ලන්තය | 23.31 |
| ස්වීඩනය | 100.00 |
| එක්සත් රාජධානිය | 92.59 |
| ඩෙන්මාර්කය | 21.44 |
| ප්‍රංශය | 70.34 |
| කොරියාව | 30.75 |
| ඔස්ට්‍රේලියාව | 32.79 |
| ඔස්ට්‍රියාව | 80.43 |
| වෙනත් ද්විපාර්ශ්වීය | 8.19 |

| | |
|---|---|
| **බහුපාර්ශ්වීය** | **25.27** |
| ආසියානු සංවර්ධන බැංකුව | 24.95 |
| ලෝක බැංකුව | 21.66 |
| වෙනත් බහුපාර්ශ්වීය | 37.07 |
| **එකතුව** | **22.28** |

## විදේශ ණය තොගය සහ විදේශ ණය සේවාකරණය

2012 වර්ෂය අවසාන වනවිට විදේශ ණය කළඹ ඇ.ඩො. බිලියන 20.3ක් වූ අතර එයින් ඇ.ඩො. බිලියන 13.6 (සියයට 68)ක් සහනදායි ණයවලින් ද, ඉතිරිය ඇ.ඩො. බිලියන 6.7 (සියයට 32)ක් වාණිජ ණය සහ සහනදායි නොවන ණයවලින් ද සමන්විත වේ.

**විදේශ ණය තොගයෙහි සංයුතිය**

| සංයුතිය | පහත දැක්වෙන වර්ෂයන්ට අදාළව එකතු වී තිබූ විදේශ ණය තොගය ( ඇ.ඩො. මිලියන ) | | | වාර්ෂික වෙනස ( ඇ.ඩො. මිලියන ) | | වෙනසෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 |
| **බහුපාර්ශ්වීය** | 6,085 | 6,341 | 6,639 | 257 | 298 | 4.2 | 4.7 |
| **ද්විපාර්ශ්වීය** | 6,439 | 7,002 | 7,160 | 563 | 157 | 8.7 | 2.2 |
| **අපනයන ණය** | 1,801 | 2,252 | 2,965 | 452 | 713 | 25.1 | 31.6 |
| **වාණිජ ණය** | 2,038 | 3,034 | 3,530 | 996 | 496 | 48.9 | 16.4 |
| **එකතුව** | 16,362 | 18,629 | 20,293 | 2,267 | 1,664 | 13.9 | 8.9 |

[1] මෙම අනුපාතය මගින් පෙන්නුම් කරනුයේ ව්‍යාපෘතියක සාමාන්‍ය කාලය මත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවයි. මෙය උපයෝජනයන්, උපයෝජනය නොවූ ශේෂයේ ප්‍රතිශතයක් ලෙස දක්වනු ලැබේ.

2011 වර්ෂයේ අවසානය වනවිට එකතු වී තිබූ ණය ප්‍රමාණයට වඩා සියයට 9කින් 2012 වර්ෂයේදී ගෙවීමට ඇති ණය ප්‍රමාණය වැඩි වී ඇත. ;එය 2010 වර්ෂය සමඟ සසඳන විට 2011 වර්ෂයේ දී සියයට 14 කි. 2012 වර්ෂය අවසානයේ එකතු වී ඇති ණය ප්‍රමාණයෙන් සියයට 29ක් ජපානයෙන් ලබාගත් ණය වන අතර සියයට 22ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය වේ. සියයට 17ක් ලෝක බැංකුවෙන් ලබාගත් ණය වන අතර සියයට 13ක් චීනයෙන් ලබාගත් ණය වේ. ඉතිරි සියයට 19ක සමස්ත ණය ප්‍රමාණය අනෙකුත් සංවර්ධන පාර්ශ්වකරුවන් සහ අනෙකුත් මූල්‍යයාතන වෙතින් ලබාගත් ණය වේ.

2007 වර්ෂයේ ලබා ගන්නා ලද ඇ.ඩො. මිලියන 500ක් වූ ජාත්‍යන්තර බැඳුම්කරයන්හි කල්පිරීම ද ඇතුළුව 2012 වර්ෂයේ සිදු වූ මුළු ණය සේවාකරණය ඇ.ඩො. මිලියන 1,635කි. මෙයින් ඇ.ඩො. මිලියන 1,197ක් ණය වාරික වශයෙන්ද ඇ.ඩො. මිලියන 438ක් පොළී ගෙවීම් ද විය.

# එක් එක් අංශයන්හි කාර්යසාධනය

# ආසියානු සංවර්ධන බැංකු අංශය

## ආසියානු සංවර්ධන බැංකුව සමඟ වන සංවර්ධන පාර්ශ්වකාරීත්වය

ආසියානු සංවර්ධන බැංකුව (ADB), ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් අතුරින් ප්‍රමුඛම පාර්ශ්වකරුවෙකු වන අතර එය ශ්‍රී ලංකාව සමඟ වසර 45කට වැඩි එලදායී සබඳතාවක් පවත්වා ඇත. 1966 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුව ස්ථාපිත කළ දා පටන් මේ වන විට ණය ගිවිසුම් 157ක් යටතේ ඇ.ඩො. බිලියන 5.6ක මුදලක් ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදී ඇති අතර තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් 249ක් යටතේ තවත් ඇ.ඩො. මිලියන 118ක් ලබාදී ඇත. ශ්‍රී ලංකාව ආසියානු සංවර්ධන බැංකුවෙන් වාර්ෂිකව ලබාගන්නා වූ ණය මුදල් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 300කට ආසන්න අගයක් ගන්නා අතර එය දළ ජාතික නිෂ්පාදිතයෙන් 0.7-0.8ක ප්‍රතිශතයකි.


## දේශීය සහභාගීත්ව උපාය මාර්ග CP 2013-2015

ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබාගන්නා විදේශ මූල්‍යයනය උපයෝජනය කරගැනීම සඳහා සකස් කරන රජයේ මධ්‍යකාලීන ක්‍රමෝපායික හා මෙහෙයුම් වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගීත්වය ඇතිව 2012 වසරේදී, 2013-2015 වර්ෂයන් ඉලක්ක කර ගනිමින් යාවත්කාලීන කරන ලදී. එම උපායමාර්ග ප්‍රධාන වශයෙන් (අ) පූර්ණ සහ තිරසාර ආර්ථික සංවර්ධනය (ආ) පුද්ගලික ආයෝජන උත්ප්‍රේරණය සහ රාජ්‍ය අංශයේ ආයෝජනයන්හි කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සහ (ඇ) මානව සම්පත් සංවර්ධනය යන අංශ කෙරෙහි අවධානය යොමු කරයි. ඒ අනුව, එය රටෙහි පරිණාමනය විදහාලමින් හා නිපුණතා සංවර්ධනය, ප්‍රවාහන සේවා හා තිරසාර බලශක්තිය ප්‍රශස්තිකරණය වැනි මැදි ආදායම් රටවල ප්‍රමුඛතා වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කෙරෙයි. මෙම අංශවල සංවර්ධනය, වේගවත් ආර්ථික සංවර්ධනය හේතුවෙන් ඇතිවන එවැනි සේවාවන්හි ඉහල ඉල්ලුම සපුරාලීම උදෙසා ඉතා වැදගත් වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවට සහනදායි හා සහනදායි නොවන අනුපාත යටතේ වාර්ෂිකව ඇ.ඩො.මිලියන 300ක ණය මුදල් ප්‍රමාණයන් ලැබෙන අතරම, 2013-2015 දක්වා යෝජනා කර ඇති සමස්ත ණය මුදල් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 926ක් වන අතර එයින් සැලකිය යුතු කොටසක් තිරසාර සංවර්ධනය සහ බලශක්තිය යන අංශයන් සඳහා භාවිතා කරනු ඇත.

## 2012 වර්ෂයේ එකඟතා හා උපයෝජනයන්

2012 වසරේ ආසියානු සංවර්ධන බැංකුව විසින් දක්වන ලද සම්පූර්ණ එකඟතාවය ඇ.ඩො. මිලියන 392කි. විදුලිබල හා බලශක්ති අංශය සඳහා ඇ.ඩො. මිලියන 130කින් ද, ජල සම්පාදනය සහ සනීපාරක්ෂක අංශය සඳහා ඇ.ඩො. මිලියන 124කින්ද, මාර්ග අංශය සඳහා ඇ.ඩො. මිලියන 98කින් ද මෙම එකඟතාවය සමන්විත වේ. වර්තමාන මූල්‍යයන ව්‍යුහය තුළ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය 30ක් ප්‍රදාන 10ක් ඇතුළත් වන අතර 2012 වසරේදී මෙම ණය යටතේ සිදුකරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. 301,952,633.24ක් විය.


**2012 වසරේ සිදුකරන ලද සමස්ත උපයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය**



## 2012 වසරේ ආසියානු සංවර්ධන බැංකු ණය වත්කම්

ආසියානු සංවර්ධන බැංකු ණය වත්කම් සමූහය ප්‍රධාන ක්ෂේත්‍ර 7ක් හරහා ව්‍යාප්ත වී ඇති අතර එයින් මාර්ග හා ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා විශාලම දායකත්වය සැපයෙන අතර ඊට අමතරව පිළිවෙලින් ප්‍රාදේශීය සංවර්ධනය අයත් වන බහු ආංශික ක්ෂේත්‍රය, ජල සම්පාදනය හා සනීපාරක්ෂාව, වරාය, විදුලිබල හා බලශක්ති, අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධනය සහ මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍රයන් සඳහා දායකත්වය ලබා දී ඇත. 2012 වසරේ දෙසැම්බර් 31 වන විට ආසියානු සංවර්ධන බැංකු ආයෝජනයෙහි ආංශික ව්‍යාප්තිය පහත රූපසටහන මඟින් නිරූපණය වේ.

ආසියානු සංවර්ධන බැංකු ආයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය (ඇ.ඩො. මිලියන)




## 2012 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති

2012 වසරේ ක්‍රියාත්මක කෙරුනු ව්‍යාපෘතීන්

| ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|
| කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 300 |
| දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 90 |
| පිවිතුරු බලශක්ති හා ප්‍රවේශ ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 160 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 154 |
| ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය | 150 |
| ද්විතියික නාගරික සහ ග්‍රාමීය ප්‍රජාපාදක ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 120 |
| ගැටුම් හේතුවෙන් හානියට පත් ප්‍රදේශ සඳහා වූ හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය | 150 |
| ධරණීය බලශක්ති ආංශික සහයෝගීතා ව්‍යාපෘතිය | 120 |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 100 |
| යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 90 |
| ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 85 |
| නැගෙනහිර සහ උතුරු මැද ප්‍රාදේශීය මාර්ග ව්‍යාපෘතිය | 70 |
| "දැනුමැති සමාජයක් සඳහා අධ්‍යපනය" ව්‍යාපෘතිය | 65 |
| වියළි කලාපීය නාගරික ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 60 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය | 50 |
| "පුර නැගුම" පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 55 |

## 2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත වූ ප්‍රධාන ව්‍යාපෘති

2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත වූ ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|
| පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 130 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 98 |
| අධ්‍යාපන ආංශීය සංවර්ධන වැඩසටහන | 200 |
| මහ කොළඹ ජල සම්පාදන සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 84 |
| වියළි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 40 |
| තාක්ෂණික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු ආංශීය සංවර්ධන ව්‍යාපෘතිය | 40 |

## 2012 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති

2012 වසරේදී අවසන් කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රතිඵලය |
|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙනුවෙන් දිරිමත් කරන ලද ව්‍යාපාරික පරිසරය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවා බෙදාහැරීමක් උදෙසා ශ්‍රී ලාංකීය ව්‍යාපාර සංවර්ධන සේවා අංශයේ වාණිජ ධාරාවන් හා වැඩිකරන ලද ධාරිතාව හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය ප්‍රවේශය වර්ධනය කිරීම මඟින් ආයෝජන ක්‍රියාවලිය උත්ප්‍රේරණය කිරීම |
| පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | නගර කළමනාකරණය වැඩිදියුණු කිරීම, පළාත් පාලන ආයතන වෙත ප්‍රමුඛතාවය ලබාදෙමින් ආංශික ආයතන වල ධාරිතාවන් සැලසුම්කරණය හා මූල්‍යයනය කිරීම, නාගරික ජන ජීවිතය උසස් කිරීම සහ නාගරික යටිතල පහසුකම් සම්පාදනය හා නඩත්තු කටයුතු පරිපාලනය සඳහා රාජ්‍ය හා පළාත් පාලන ආයතන වල සේවක ධාරිතාවය ඉහල නැංවීම |
| ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය | ජාතික මහාමාර්ග ජාලය වැඩිදියුණු කිරීම සහ මහාමාර්ග ආංශික ආයතන ශක්තිමත් කිරීම |

## 2012 විශේෂ අවස්ථා

- මාර්තු - ආසියානු සංවර්ධන බැංකුවේ පුද්ගලික අංශයේ ප්‍රධාන උපසභාපති ලක්ෂ්මි වෙන්කටචලාම් මහත්මියගේ පැමිණීම
- මැයි - පිලිපීනයේ මැනිලා නුවර පවත්වන ලද 45 වන ආසියානු සංවර්ධන බැංකු සමුළුව
- ජුනි - ආසියානු සංවර්ධන බැංකුවේ දකුණු ආසියානු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ජුආන් මිරැන්ඩා මහතා ඉහළ පෙලේ උපදේශන කටයුතු සඳහා පැමිණීම
- සැප්තැම්බර් - ආසියානු සංවර්ධන බැංකුවේ උපසභාපති ක්ෂියායු සාඕ මහතා ඉහළ පෙලේ උපදේශන කටයුතු සඳහා පැමිණීම
- ඔක්තොම්බර් - ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම
- නොවැම්බර් - ණය ගිවිසුම් අත්සන් කිරීම - උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘති - අතිරේක මූල්‍යයනය
- 2012 වසරේදී ආසියානු සංවර්ධන බැංකුවේ දූත පිරිස් 97ක් පැමිණීම


# ජපාන අංශය

ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ජපාන රජය, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) මගින් ලබාදෙනු ලබන නිල සංවර්ධන සහයෝගිතාවන් ඒකරාශි කිරීම ජපාන අංශයේ මූලික වගකීම වේ.

## ආංශික වශයෙන් ආයෝජන විශ්ලේෂණය

වරාය, විදුලිබල හා බලශක්ති, ජල සම්පාදන සහ මාර්ග වැනි ප්‍රමුඛ අංශයන්හි ආයෝජනය කිරීමෙන්, ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය කෙරෙහි සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරමින්, 2012 වසරේ දෙසැම්බර් වන විට ජපාන අංශයේ වර්තමාන ක්‍රියාකාරී ව්‍යාපෘති කළඹ, ජපාන රජය වෙතින් අරමුදල් සම්පාදනය කරනු ලැබූ ඇ.ඩො. මිලියන 2,495.2ක වටිනාකමක් ඇති ව්‍යාපෘතීන් 29කින් සමන්විත වේ. මෙම මුළු ව්‍යාපෘති කළඹින් 26ක්, ඇ.ඩො. මිලියන 2,482.7ක වටිනාකමකින් යුතු ණය ව්‍යාපෘති වන අතර තවත් ව්‍යාපෘති 3ක් ඇ.ඩො. මිලියන 12.5ක වටිනාකමකින් යුතු ප්‍රදාන ව්‍යාපෘති වේ.

ව්‍යාපෘති කළඹ ආංශික ලෙස




## 2012 වසරේ ඒකගතාවන්

2012 වසරේදී ජපාන රජය විසින් සහනදායී ණය හා ප්‍රදාන හරහා ලබාදෙන ලද සමස්ත ඒකඟතාවල වටිනාකම ඇ.ඩො. මිලියන 521.3කි. මෙම ඒකඟතාවයන් තුළ ඇ.ඩො. මිලියන 508.7ක වටිනාකමකින් යුතු ණය ව්‍යාපෘති 3ක් අන්තර්ගත වේ. බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය -අදියර 2 - ඇ.ඩො. මිලියන 346, හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 115.3, නැගී එන ප්‍රදේශයන්හි මූලික සමාජ සේවා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඇ.ඩො. මිලියන 47.4 වශයෙනි.

2012 වසර ඇතුළත ජපානයෙන් ඇ.ඩො. මිලියන 12.5ක ජපන් අධාර ප්‍රදාන ලබා දී ඇති අතර කාර්මික උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය ඇ.ඩො. මිලියන 3.7, කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 8.3 හා කැළණිය හා සබරගමුව විශ්වවිද්‍යාලවල ජපන් භාෂා අධ්‍යයන උපකරණ සංවර්ධනය උදෙසා ඇ.ඩො. මිලියන 0.5ක් මේ තුළ අන්තර්ගත වේ. ඉහත ව්‍යාපෘතීන්හි වටිනාකම් අනුව, රජය විසින් ප්‍රමුඛතාවයක් ලබා දී ඇති ක්ෂේත්‍ර ලෙස මහාමාර්ග හා ප්‍රවාහන, වරාය, විදුලිබල හා බලශක්ති සහ මූලික යටිතල පහසුකම් සංවර්ධන වැනි ක්ෂේත්‍ර හඳුනාගත හැක.

## 2012 වසරේ උපයෝජනයන්

ජපන් ආධාර ව්‍යාපෘති යටතේ 2012 වසරේදී සමස්ත ආංශික උපයෝජනය ඇ.ඩො. මිලියන 395.8ක් වූ අතර එය පසුගිය වර්ෂ 5හි සාමාන්‍ය උපයෝජන මට්ටම වන ඇ.ඩො. මිලියන 339.2 සමඟ සසඳන විට ඉහළ උපයෝජනයකි. මාර්ග හා පාලම් සංවර්ධනය සඳහා ඇ.ඩො. මිලියන 226.38ක් විදුලිබල උත්පාදනය සඳහා ඇ.ඩො. මිලියන 78.89ක් ජල සම්පාදනය සඳහා ඇ.ඩො. මිලියන 47.25 හා වෙනත් අංශයන් සඳහා ඇ.ඩො. මිලියන 43.28ක් මේ අතර වේ.

2012 වර්ෂයේදී ජපාන ආධාර වලින් ඇ.ඩො. මිලියන 28.6ක් උපයෝජනය වූ අතර එයින් සියයට 52ක් සෞඛ්‍ය, සියයට 36ක් මහාමාර්ග හා පාලම්, සියයට 9ක් මානව සම්පත් සංවර්ධන, සියයට 2ක් මාධ්‍යය, සියයට 1ක් ජල සම්පාදන යන ක්ෂේත්‍ර සඳහා වෙන් වුණි.

## 2012 වසරේ ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රමුඛ ව්‍යාපෘතීන්

2012 වසරේ ක්‍රියාත්මක වෙමින් පැවති ප්‍රමුඛ ව්‍යාපෘතීන්

| ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|
| **ණය** | |
| ස්වභාවික හදිසි ආපදා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 91.4 |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I හා II,2-1) | 743.5 |
| මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 152.4 |
| දිළිඳුකම දුරලීම අරමුණු කරගත් ආර්ථිකය නංවාලීමේ හා ප්‍රජාව බලගැන්වීමේ ව්‍යාපෘතිය (PEACE) | 49.6 |
| පළාත්/ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම, සබරගමුව හා නැගෙනහිර පළාත) | 142.0 |
| ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 124.0 |
| ඉහළ කොත්මලේ ජලවිදුලිබල ව්‍යාපෘතිය (අදියර I හා II) | 300.0 |
| වවුනියා - කිලිනොච්චි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 29.5 |
| ජල අංශය සංවර්ධන ව්‍යාපෘතිය (අදියර I හා II) | 190.8 |
| කොළඹ නගරයේ විදුලිය බෙදා හැරීමේ සංවර්ධන ව්‍යාපෘතිය | 45.5 |
| දිළිඳුකම දුරලීම අරමුණු කර ගත් නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 38.1 |
| සංචාරක ක්ෂේත්‍රයේ පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 22.2 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය (11) | 162.9 |
| දිළිඳුකම පිටු දැකීම සඳහා වූ සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය - 11 | 23.9 |
| බලශක්ති විවිධාංගීකරණය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය (ඉංජිනේරු සේවා) | 7.6 |
| නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය | 53.0 |
| හබරන - වේයන්ගොඩ විදුලි සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය | 115.3 |
| නැගී එන ප්‍රදේශයන් ඉලක්ක කරගනිමින් මූලික සමාජ සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 47.4 |
| කුඩා හා සුළු කර්මාන්ත නායකත්ව හා ව්‍යවසායකයින් නංවාලීමේ ව්‍යාපෘතිය - 111 | 93.0 |
| පරිසර හිතකාමී විසඳුම් අරමුදල් ව්‍යාපෘතිය - 11 | 50.6 |
| **ප්‍රදාන** | |
| කිළිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපන කටයුතු | 8.3 |
| කැළණිය හා සබරගමුව විශ්වවිද්‍යාලයන්හි ජපන් භාෂාව ඉගැන්වීමේ උපකරණ වැඩිදියුණු කිරීම | 0.5 |
| කාර්මික නිෂ්පාදන සැපයීම | 3.7 |

## කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම.

පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම් මූලික අවශ්‍යතා ලෙස ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇති අතර එම පහසුකම් සැපයීම තුළින් ජලය මඟින් බෝවන රෝග අඩුකරලීම මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ. සුරක්ෂිත ජල පහසුකම් හා සනීපාරක්ෂක කටයුතු වර්ධනය කිරීම මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීමට ඉවහල් වන අතර එමඟින් මන්දපෝෂණයත්, දරිද්‍රතාවයත් තවදුරටත් අඩුකිරීමට උපකාරී වේ. 2012 දී අත්සන් කරන ලද කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියට ජපාන රජයෙන් ඇ.ඩො. මිලියන 8.3ක ප්‍රදාන අනුග්‍රහයක් ලබා දී ඇත. රට තුළ ගැටුම්කාරී වාතාවරණය පැවති සමයේ ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. ප්‍රදේශයේ ජල පිරිපහදු පහසුකම් වර්ධනය කිරීමට ද ජලය පාදක කොට ව්‍යාප්ත වන රෝග පාලනය කිරීම හා සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට ද උපකාරී වෙයි. ප්‍රදේශයේ ජල පිරිපහදු පහසුකම් වර්ධනය කිරීමට ද ජලය පාදක කොට ව්‍යාප්ත වන රෝග පාලනය කිරීම හා සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමට ද උපකාරී වෙයි. මෙම ව්‍යාපෘතිය මඟින්, එම ප්‍රදේශයේ වෙළඳ හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, පුද්ගලික ආයතන, ආගමික සිද්ධස්ථාන හා නැඟී එන කර්මාන්ත සඳහා ලැබිය යුතු ගෘහස්ථ නොවන ජල ඉල්ලුම සපුරාලීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම වර්ෂ 2020 දී අපේක්ෂිත ජල ඉල්ලුම සපුරාලීම සඳහා ද අරමුණු කරයි.

ඒ අනුව ව්‍යාපෘති අභිමතාර්ථ සැබෑකරගැනීම සඳහා පිළිවෙලින් නව ජල පවිත්‍රාගාරයක්, එහි සිට ජල සම්ප්‍රේෂණ මාර්ගයක්, ජල බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් හා කිලිනොච්චි හා පරන්තන්හි ඝන මීටර 1000ක හා ඝන මීටර 450ක ධාරිතාවකින් යුත් ජල කුළුණු 2ක් ඉදිකිරීමට නියමිතය. ඊට අමතරව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 14ක වෙසෙන 20,000කට අධික ජනතාවට ප්‍රතිලාභ සලසමින් පරන්තන් ප්‍රදේශයට ජලය බෙදාහරින මධ්‍යස්ථානයක් හා නිවාස 1500කට අධික ප්‍රමාණයක් සම්බන්ධ කරමින් ඉරණමඩු හන්දියේ සිට කිලෝ මීටර 42ක දුරකට ජල නල මාර්ගයක් ඉදිකරනු ලබයි.

## නැඟී එන ප්‍රදේශයන්හි මූලික සමාජ සේවා පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

නැඟී එන ප්‍රදේශවල සංවර්ධනය ඉලක්ක කර ගනිමින් 2012 දී අත්සන් කරන ලද මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් මූලික සමාජ අවශ්‍යතා වර්ධනය කිරීම උදෙසා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය හරහා ශ්‍රී ලංකා රජය ඇ.ඩො. මිලියන 47.4ක ණය මුදලක් ලබා ගෙන ඇත. ව්‍යාපෘතිය ප්‍රධාන සංරචකයන් 2කින් යුක්ත වේ.

- **රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාව වැඩි කිරීම**

  රජයේ ඖෂධ අවශ්‍යතාව සපුරාගැනීම උදෙසා වාර්ෂිකව බෙහෙත් පෙති මිලියන 4000ක නිෂ්පාදන ධාරිතාවක් සඳහා සහාය මෙහෙයුම් යන්ත්‍රයක් සමඟ ඉහළ ධාරිතාවකින් යුතු නව නිෂ්පාදන යන්ත්‍ර 4ක් ස්ථාපිත කිරීම.

- **ද්විතීයික රෝහල් වැඩි දියුණු කිරීම හා නවීන, ගුණාත්මක සෞඛ්‍යාරක්ෂිත සේවා සැපයීම.**

  තෘතීය වෛද්‍ය ආයතන වල පුද්ගල තදබදය අවම කිරීම හා ප්‍රාදේශීය ප්‍රජාවගේ මරණයට පත් වීමේ ප්‍රවනතාවයන් අඩු කිරීම උදෙසා මධ්‍යම, සබරගමුව, වයඹ හා නැගෙනහිර පළාත් වල තෝරා ගත් ද්විතීයික රෝහල් 4ක් අවශ්‍ය පහසුකම් සහිතව වැඩි දියුණු කොට ප්‍රධාන රෝහල් වශයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

  ඊට අමතරව මධ්‍යම, සබරගමුව, වයඹ, උතුරු මැද, ඌව, නැගෙනහිර හා උතුරු පළාත් වල රෝහල් සඳහා උසස් තාක්ෂණයෙන් යුත් ගිලන් රථ 124ක් ලබා දීම. වසර 10ක සහන කාලයක් ඇතුළුව වසර 40ක ආපසු ගෙවීම් කාල සීමාව ඉක්ම යාමට පෙර ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ මෙම ව්‍යාපෘතිය මඟින් උත්පාදනය කෙරෙනු ඇත.

## වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය ||

කිලිනොච්චි ග්‍රිඩ් උපපොල ඉදිකිරීම හා වවුනියාව සිට කිලිනොච්චි දක්වා කි.මෝ. 132ක සම්ප්‍රේෂණ මාර්ගය යලි සම්බන්ධ කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 15.2ක මූල්‍ය ආයෝජනයක් කෙරිණි. යුධ වාතාවරණය පැවති සමයේදී ත්‍රස්තවාදීන් විසින් විනාශකරන ලද උතුරු පළාතේ විදුලි සම්ප්‍රේෂණ මාර්ගය නැවත වැඩිදියුණු කර පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම, ආර්ථිකය සංවර්ධනය කිරීම මඟින් ප්‍රදේශයේ සාමය ගොඩනැංවීමේ දායකත්වය ලබාදේ. උතුරු පළාතේ ගෘහස්ථ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා රාජ්‍ය සේවා සඳහා ප්‍රතිලාභ සැලසීමට විදුලිබල පද්ධතියේ සමස්ත සම්ප්‍රේෂණ ධාරිතාව ව්‍යාපෘතිය විසින් වැඩි කරනු ලබයි. වසර 10ක සහන කාලයක්ද ඇතුලත්ව වසර 40ක නැවත ගෙවීමේ කාලසීමාවට යටත්ව සහනදායි පොළී අනුපාත යටතේ මෙම ණය ලබාගෙන ඇත.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය. උතුරු වසන්තය සංවර්ධන වැඩසටහන යටතේ කිලිනොච්චියේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2012 සැප්තැම්බර් 25 වන දින මෙම විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය ජනතා අයිතියට පවරන ලදී.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුගත වෙමින්, තිරසාර ආර්ථික සංවර්ධනය කරා රට මෙහෙයවීම සඳහා ඇ.ඩො. මිලියන 520ක මූල්‍යාධාර 2012/2013 මූල්‍ය වර්ෂය සඳහා ලබාගැනීම උදෙසා ජපන් රජය සමඟ වාර්ෂික යෙන් ණය පිළිබඳ සාකච්ඡා පවත්වන ලද අතර එහිදී ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු ව්‍යාපෘති 4ක් රජය විසින් හඳුනාගනු ලැබ ඇත. අගනුවර වැඩි වන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා මහ කොළඹ විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය, දිවයින පුරා පාලම් 37ක් ඉදිකිරීම මඟින් මාර්ග සම්බන්ධතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, අනපේක්ෂිත ආපදා හේතුවෙන් ආර්ථික කටයුතු හා මනුෂ්‍ය ජීවිතවලට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා නායයෑම් ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතිය සහ අනුරාධපුර උතුරු ප්‍රදේශයේ ජනතාව සඳහා සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා අනුරාධපුර උතුරු ජලසම්පාදන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති එහි ඇතුළත් වේ. ඉහළ මැදි ආදායම් තත්ත්වය කරා වෙනස්වීමේ අරමුණින් යුතුව රටේ යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා රජය කටයුතු කරමින් සිටින හෙයින්, වාර්ෂික යෙන් ණය පැකේජය ඇ.ඩො. මිලියන 500 ඉක්මවා වර්ධනය කෙරුණු 2012 වසරේ හැරවුම් ලක්ෂය අනාගත ණය පැකේජයන් සම්බන්ධයෙන් නොකඩවා පවතිනු ඇත.

## කාර්මික නිෂ්පාදන සැපයීම උදෙසා ජපාන ප්‍රදාන ආධාර

ජීවිත අපේක්ෂාව වැඩි කිරීමේ හා ජීවන තත්ත්වය වර්ධනය කිරීමේ පුළුල් පරමාර්ථය ඇතිව, රජය දේශීය ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි නිරන්තර සැලකිල්ලක් දක්වයි. රජය රටේ ආර්ථික හා සමාජ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා දායකත්වය සැපයීමේ අරමුණ ඇතිව ජපානයේ නිෂ්පාදිත කාර්මික උපකරණ ලබා ගැනීමට ජපාන රජයෙන් ව්‍යාපෘති නොවන ආධාර ඇ.ඩො. මිලියන 3.7ක ප්‍රදානයක් ලබා ගෙන ඇත. මෙම ප්‍රදාන කුරුණෑගල ශික්ෂණ රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල, අම්පාර මහ රෝහල, බදුල්ල මහ රෝහල හා රත්නපුර මහ රෝහල ආදී රෝහල් සඳහා CR පද්ධති, එන්ඩෝස් පද්ධති වැනි වෛද්‍ය උපකරණ සැපයීම සඳහා භාවිතා කර ඇත.

එමෙන්ම ස්වයංක්‍රිය රසායනික විශ්ලේෂකයන් වැනි අධි තාක්ෂණික වෛද්‍ය උපකරණවලට අමතරව සෞඛ්‍ය ආයතන වල පවතින ප්‍රතිකාරක ආරක්ෂණ සේවා වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සභා මඟින් පාලනය වන ශික්ෂණ රෝහල් හා වෛද්‍ය පර්යේෂණ ආයතන සඳහා විකිරණ යන්ත්‍ර, ජංගම අතිධ්වනි රෝග

පද්ධති හා පීඩනතාපක මෙම ව්‍යාපෘතිය යටතේ සම්පාදනය කොට ඇත.

## හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය

බලශක්ති හා ප්‍රවාහන යටිතල පහසුකම් සහිත ආර්ථික පදනමකින් ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව හබරණ හා වේයන්ගොඩ අතර විදුලි සම්ප්‍රේෂණ හානිය අවම කරමින් කි.වො. 220ක විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මගින් පහසුකම් සලසයි. ඊට අමතරව, මෙම ව්‍යාපෘතිය සාම්පූර් ගල්අඟුරු බලාගාරය සමඟ සම්බන්ධිත අතර බලශක්ති උත්පාදනය සම්බන්ධ අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා ද දායක වෙයි. සම්ප්‍රේෂණ පද්ධතියේ ස්ථායිතාව හා විශ්වාසනීයත්වය ළඟා කර ගැනීමේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම හා රටේ වැඩිවන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ඇ.ඩො. මිලියන 115.3ක උපයෝජනය විය. මෙම ව්‍යාපෘතිය තුල භාවිත කරන තාක්ෂණය අනුව සියයට 22කින් පමණ වාර්ෂික බලශක්ති අලාභහානිය පහළ හෙලීමටත්, කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩුකිරීමටත් අපේක්ෂා කරයි. තවද බාධා වලින් තොරව අඛණ්ඩව විදුලි සැපයීමක් තහවුරු කරන අතර වඩා සංවිධිත හා ඵලදායි ආකාරයකට සිය ආර්ථික ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමට අවස්ථාව උදාවෙයි. ව්‍යාපාරික ප්‍රජාවට හා නිෂ්පාදකයින්ට නව අවස්ථා සලසා දෙමින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා සෘජුව දායකත්වය සලසයි.

## 2013 වසරේ දී ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

### යෙන් ණය යෝජනාවලිය

ශ්‍රී ලංකා රජය සහ JICA අතර සිදුකරන ලද සම්මුති සාකච්ඡා මත පදනම්ව, 2013 වසරේදී 43වන යෙන් ණය පැකේජය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘතීන් මූල්‍යයනය සම්බන්ධ මූලික කටයුතු අවසන් කර ඇත.

- මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය
- ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය
- නාය යෑමේ ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය
- අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1

ඉහළ ආර්ථික හා සමාජ සංවර්ධන අභිලාෂයන් ඉටු කරගැනීමේ අරමුණින් මෙකී ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා සමස්ත ඇස්තමේන්තු ගත ඒකඟතා ප්‍රමාණය ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 428.9ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## වාර්ෂික ප්‍රදාන ආධාර වැඩසටහන්

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය අමාත්‍යාංශ සමඟ කෙරුනු සාකච්ඡා මත පදනම්ව හඳුනාගනු ලැබූ ව්‍යාපෘති 12කින් සමන්විත වූ ව්‍යාපෘති යෝජනාවලියක් 2012/2013 මූල්‍ය වර්ෂය තුළ ජපන් ප්‍රදාන ආධාර, තාක්ෂණික සහයෝගීතා සහ සංවර්ධන අධ්‍යයන යන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීම සලකා බැලීම සඳහා අදාළ නිල ඉල්ලීම් ජපාන තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

## 2012 වසරේදී සිදු වූ සුවිශේෂී කාර්යයන්

### දූත කණ්ඩායම්

අදාළ රේඛීය අමාත්‍යාංශයන්ගේ නිර්දේශ සහිතව, ජපාන අංශය 2012 වසරේදී ජපාන දූත කණ්ඩායම් 100කට අදාළ අනුමැතීන් ලබාදෙමින් පහසුකම් සපයා ඇත. මේ අතරින් බොහොමයක් දූත කණ්ඩායම් ව්‍යාපෘති ඇගයීම හා ක්‍රියාත්මක ආධාර සඳහා වූ දූත කණ්ඩායම් වන අතර අදාළ ව්‍යාපෘති විධිමත් අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහාය එම ව්‍යාපෘති කාර්ය මණ්ඩල වෙත ලබාදී ඇත. එසේම එම දූත කණ්ඩායම් ව්‍යාපෘතීන්හි වර්තමාන ආයෝජන තත්ත්වයන් විශ්ලේෂණය කිරීම මගින් අනාගත ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනයක් ද සිදුකර ඇත.

### වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය විවෘත කිරීම

වවුනියා කිලිනොච්චි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය, උතුරු වසන්තය සංවර්ධන වැඩසටහන යටතේ කිලිනොච්චියේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2012 සැප්තැම්බර් 25 වන දින ජනතා අයිතියට පවරන ලදී.

### ජපාන නියෝජ්‍ය අගමැති කට්සුයා ඔකඩා මහතා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම


ශ්‍රී ලංකාව හා ජපානය අතර ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කිරීම සඳහා ජපාන නියෝජ්‍ය අගමැති කට්සුයා ඔකඩා මහතා 2012 මැයි මස ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර අක්කරායකුලම් ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීමටද සහභාගී විය.

# ලෝක බැංකු අංශය

ලෝක බැංකුව වෙතින් ලැබෙන සංවර්ධන ආධාර ඒකරාශී කිරීම හා එම ආධාර සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවීමට පහසුකම් සැලසීම මෙම අංශයේ වගකීම වේ.

රජයේ සංවර්ධනය ප්‍රමුඛතාවන්ට අනුව, ලෝක බැංකු ක්‍රමෝපායි සැලැස්ම 2009 - 2012 යටතේ සහනදායී කොන්දේසි මත ඇ.ඩො. මිලියන 900ක මුදල් ප්‍රමාණයක් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මානව සම්පත් සංවර්ධනය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ලබා දීමට සැලසුම් කර ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය මැදි ආදායම් ලබන රටක ආර්ථික තත්ත්වයට පරිවර්තනය වීම හේතුවෙන් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (IBRD) සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) වෙතින් මිශ්‍ර ණය ලබා ගැනීමේ අවස්ථාව 2010 දෙසැම්බර් මස සිට උදා වී ඇත.

මූල්‍ය එකඟතා හා උපයෝජන 2007-2012 (ඇ.ඩො. මිලියන)



## එකඟතා 2012

වර්ෂ 2007 සිට 2012 කාලය තුළදී ඇ.ඩො. මිලියන 1135.3ක ණය මුදල් හා ඇ.ඩො. මිලියන 37.8ක ප්‍රදානයන් ලෝක බැංකුවෙන් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. මෙම කාලය තුළදී ගිවිසුම් 36ක් අත්සන් කර ඇති අතර, එයින් පහත දක්වා ඇති ගිවිසුම් 7, 2012 වසරේදී අත්සන් කර ඇත.

**අත්සන් කරන ලද ගිවිසුම් - 2012**

| ව්‍යාපෘතිය | ණය / ප්‍රදාන | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|---|
| කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | ණය | 213.0 |
| පාසැල් අධ්‍යාපනය දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය | ණය | 100.0 |
| ඊ-ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතිය (අතිරේක මුල්‍යයනය) | ණය | 11.0 |
| ගබඩා ලදුපත මුල්‍ය මෙවලමක් ලෙසින් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය | ප්‍රදාන | 6.5 |
| දිරිසවිය - මුල්‍යාධාර සැපයීම හා පුහුණු ලබා දීම තුළින් ආබාධිත පුද්ගලයින්ට උපකාරී කිරීම | ප්‍රදාන | 2.59 |
| කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ප්‍රදාන) | ප්‍රදාන | 0.9 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රදාන | 0.5 |

2009 - 2012 කාලය සඳහා ලෝක බැංකුව එකඟ වී ඇති ඇ.ඩො. මිලියන 900ක මුළු සම්පත් ප්‍රමාණයෙන් ඇ.ඩො. මිලියන 324ක ප්‍රමාණයක් 2012 වර්ෂය සඳහා වෙන් කොට තිබුණි. 2012 වසර තුළදී ඇ.ඩො. මිලියන 1,043.9ක ආයෝජනයක් සහිතව සංවර්ධන ව්‍යාපෘති 24ක් ක්‍රියාවට නංවා තිබෙන අතර, ඉන් සැලකිය යුතු ප්‍රමාණයක ආයෝජනයක් උතුරු හා නැගෙනහිර පළාත් ආවරණය කරමින් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යොදවා ඇත.

රජය 2012 වසරේදී, ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව වෙතින් ඇ.ඩො. මිලියන 213ක් කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලබා ගත් අතර, මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජයේ ද මුල්‍ය සහයෝගීතාවය 2012 අප්‍රේල් මස සිට 2017 ජුනි මස දක්වා ක්‍රියාත්මක කරනු ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය සඳහා වු සංවර්ධන කාර්යරාමුව හා වැඩසටහන 2012 - 2016 යටතේ පාසල් අධ්‍යාපනය දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 100ක ණය මුදලක් 2012 වසරේදී ලෝක බැංකුව වෙතින් ලබා ගෙන ඇත. තවද, ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ ඊ-රාජ්‍ය සේවාවට අදාල කාර්යයන් සඳහා පවතින අවශ්‍යතාවන් සඳහා ලෝක බැංකුව වෙතින් අතිරේක මුල්‍යකරණය ලබා ගැනීමටද 2012 වසරේදී රජයට හැකි විය. තවද, ඊ-ක්‍රියාකාරකම්වල වත්මන් ප්‍රවර්තක ශක්තිය පවත්වාගෙන යාම සඳහා 2012 වසර තුලදී ඊ-ශ්‍රී ලංකා ව්‍යාපෘතිය වෙනුවෙන් අතිරේක මුදලක් ලබා ගැනීමට රජයට හැකි විය. මෙම ව්‍යාපෘතිය මඟින් පුද්ගලික අංශයේ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කරන අතර, විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ද ඊ-ව්‍යාපාරකරණය උදෙසා රාජ්‍ය සේවා පහසුකම් සමඟ දුරස්ථ ප්‍රදේශවල තොරතුරු හා සන්නිවේදන භාවිතය සඳහා වන සමාන ප්‍රවේශ සංවර්ධනයද සිදු කරනු ඇත.


ලෝක බැංකුවෙහි ප්‍රදාන ආධාර මුලික වශයෙන් “දිරිසවිය” වැඩසටහන මඟින් මුල්‍යාධාර සැපයීම සහ ආබාධිතයින් හට පුහුණුව ලබා දීම තුලින් ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා ලබා දී ඇත.

## උපයෝජන 2012

2007- 2012 කාලය තුලදී මුල්‍ය උපයෝජනය සියයට 23කින් ඉහල ගොස් ඇති අතර, ඉහලම උපයෝජනය වු ඇ.ඩො. මිලියන 217.21ක මුදල 2011 වර්ෂයේදී වාර්තා විය. 2012 වසරේ සාපේක්ෂ වශයෙන් අඩු උපයෝජනයට හේතු ලෙස ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන හා ක්‍රමවේදයන්ගේ ප්‍රමාදවීම් සහ රාජ්‍ය අංශයේ ධාරිතාව නැංවීමේ ව්‍යාපෘතියෙහි සංඛ්‍යාත්මක කොටසෙහි දුර්වල කාර්යසාධනය දැක්විය හැකිය.

එනමුදු, 2012 වසරේදී උපයෝජනයන්ගෙන් ඉහලම අගය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ වාර්තා කර ඇති අතර, යටිතල පහසුකම් සංවර්ධන අංශය දෙවන ඉහලම උපයෝජනය පෙන්නුම් කරයි. තවද, ඇ.ඩො. මිලියන 16ක පමණ සැලකිය යුතු ප්‍රමාණයක උපයෝජනයක් අධ්‍යාපන අංශය වාර්තා කරයි.

2012 වර්ෂය තුළ ආංශික උපයෝජනය




2012 වසර තුළදී රාජ්‍ය වියදම්වල ඵලදායීතාව වර්ධනය කරනු පිණිස තනි ව්‍යාපෘති පිළිබඳ අවධානය වෙනුවට වැඩසටහන් ඉලක්ක කරගත් මුල්‍යනය සඳහා ලෝක බැංකුව දිරිමත් කරවීමට වැඩිදුර පියවර ගනු ලැබීය. උදාහරණ වශයෙන්, පාසල් අධ්‍යාපන දැනුම කේන්ද්‍රකරගත් අධ්‍යාපන ක්‍රමයකට පරිවර්තනය කිරීම සඳහා ලෝක බැංකුව මඟින් සිදු කල මුල්‍යයන, වැඩසටහන් මුල්‍යකරණය මත පදනම් වන අතර, දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන වැඩසටහන මුල්‍යයනය සඳහා ද ලෝක බැංකුවෙන් ණය මුදලක් ලබා ගැනීමට පියවර ගෙන ඇත.

## විශේෂ අවස්ථා සහ ලෝක බැංකු දූත මණ්ඩල

- ලෝක බැංකුවේ කළමනාකරණ අධ්‍යක්ෂතුමාගේ ශ්‍රී ලංකා සංචාරය සුදානම් කිරීම සහ අදාල පහසුකම් සැපයීම.
- ලෝක බැංකු නියෝජිත කණ්ඩායම් 91ක් සහ නියෝජිතයන් 160දෙනෙකු සඳහා වීසා ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම.

# මැදපෙරදිග හා සාක් කලාපයේ රටවල්

## මැදපෙරදිග කලාපයේ රටවල්


මැදපෙරදිග කලාපයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන නිල සංවර්ධන සහයෝගයන් ඒකරාශී කිරීම හා එම මුදල් සංවර්ධන කටයුතුවලට යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙම අංශය හරහා සිදුවේ. ඉරානය, කුවේට් හා සෞදි අරාබිය යන රටවල් මෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා වු ඔපෙක් අරමුදල වැනි සංවිධාන ද මැදපෙරදිග කලාපයේ සංවර්ධන හවුල්කරුවන්ය. සෞඛ්‍ය, වාරිමාර්ග හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්ගේ දීර්ඝකාලීන සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මෙන්ම විදුලිය හා බලශක්ති, මහා මාර්ග හා පාලම් වැනි ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ද මැදපෙරදිග කලාපයෙන් දිගුකාලීන සංවර්ධන සහයෝගයන් අඛණ්ඩව ලබා දී ඇත.

## 2012 වසරේ සිදු කළ එකඟතා

2012 වසරේ මැදපෙරදිග කලාපයේ රටවල් ඇ.ඩො. මිලියන 100ක් එකඟතාවයන්ට එළඹ ඇත. රට තුළ ජාතික මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම උදෙසා මෙම එකඟතාවයන්ට එළඹ ඇති අතර, ඉන් ඇ.ඩො. මිලියන 60ක් සෞදි සංවර්ධන අරමුදල ද ඇ.ඩො. මිලියන 40ක් ආර්ථික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලද ලබා දීමට එකඟතාවය පළ කර ඇත.

මෙම ණය මුදල් පොල්ගහවෙල, කෑගල්ල මාර්ගයෙන් පාලමක් ඉදිකිරීමට ද ඇතුළුව ජාතික මාර්ග පද්ධතිය මාර්ග 13ක කිලෝමීටර් 208ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යෙදවීමට සැලසුම් කර ඇත. දැඩි වාහන තදබදයක් සහිත මාර්ගවල මාර්ග සම්බන්ධතා වර්ධනය කිරීම තුළින් ප්‍රවාහනයේදී සිදු වන ප්‍රමාදයන් අවම කරමින් ගමනාගමනය සඳහා ගතවන කාලය අවම කිරීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් බලාපොරොත්තු වේ.

## 2007 - 2012 කාලය තුළ එළඹි එකඟතා




2007 - 2012 කාලය තුළ මැදපෙරදිග කලාපයේ සංවර්ධන පාර්ශ්වකරුවන් ඇ.ඩො. මිලියන 760ක ණය ආධාර ලබා දීමට එකඟ වී ඇති අතර, ඉන් ඇ.ඩො. මිලියන 532ක් මුදලක් ලබා දී ඇත්තේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහාය. 2007 - 2012 කාලය තුළ මහා මාර්ග සංවර්ධනය සඳහා උපයෝජනය වූ මුදල ඇ.ඩො. මිලියන 108ක් වූ අතර විදුලිබල හා බලශක්ති සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්ගේ උපයෝජනයන් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 88.7ක්, 20ක් හා 17.5ක් විය.

## 2012 ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති


| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | ණය / ප්‍රදාන ඇ.ඩො. මිලියන | උප එකතුව ඇ.ඩො. මිලියන |
|---|---|---|---|
| ඉරානය | උමා ඔය ජලවිදුලි හා වාරි ව්‍යාපෘතිය | 450.00 | ***538.75*** |
| | ග්‍රාමීය විදුලිබල සැපයීමේ ව්‍යාපෘතිය 8 | 88.75 | |
| සෞදි සංවර්ධන අරමුදල | අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 20.00 | ***166.00*** |
| | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 46.00 | |
| | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය | 60.00 | |

| | | | |
|---|---|---|---|
| **කුවේට්** | පාලම් ප්‍රතිසංස්කරණය හා නවීකරණය ව්‍යාපෘතිය | 16.58 | |
| | සුනාමියෙන් හානියට පත් ප්‍රදේශවල තෘතියික අධ්‍යාපන හා පරිපාලන ඒකක වැඩිදියුණු කිරීම | 20.00 | |
| | මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය - ශක්‍යතා අධ්‍යයනය | 0.85 | *84.93* |
| | ඊසාන දිග විශ්ව විද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය 1 - ඊ | 10.5 | |
| | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 37.00 | |
| **ඔපෙක්** | ජාතික මහා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 8.00 | |
| | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 16.00 | *64.00* |
| | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය | 40.00 | |
| | **මුළු එකතුව** | | **853.68** |

## 2012 වසරේ උපයෝජන

පසුගිය වසර පහ තුළ මැදපෙරදිග කලාපයේ රටවලින් වූ මුළු උපයෝජනය ඇ.ඩො. මිලියන 143.65ක් වූ අතර, ඉන් 2012 වසරේ උපයෝජනය ඇ.ඩො. මිලියන 56.36කි. එය 2007 වසරේ ඇ.ඩො. මිලියන 12.9ක් වූ උපයෝජනයට වඩා සියයට තුන්සියයක ප්‍රතිශතයකටත් වඩා වැඩි වර්ධනයකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය හා ග්‍රාමීය විදුලිබල සැපයීම් ව්‍යාපෘතියේ සිදු වූ ඇ.ඩො. මිලියන 48.4ක උපයෝජනයයි

## උපයෝජනය 2007 - 2012



## 2012 වසරේ අවසන් කල ව්‍යාපෘති

අරාබි සංවර්ධනය සඳහා වු කුවේට් අරමුදල මඟින් මුල්‍ය පහසුකම් සැපයු ඊසාන දිග විශ්ව විද්‍යාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය I අදියර සාර්ථකව අවසන් කරන ලදි.

## 2012 වසරේ සිදුවු විශේෂ සිදුවීම්

- මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ගිවිසුම් අත්සන් කිරීම සඳහා සෞදි අරාබි රාජධානියේ මුදල් අමාත්‍යාංශය හා සෞදි සංවර්ධන අරමුදලේ ගරු සභාපති වෛද්‍ය ඉබ්රාහිම් අබ්දුලාසීස් අල් අසාෆ් 2012 ඔක්තෝබර් 27-30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.

- මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ගිවිසුම් අත්සන් කිරීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වු ඔපෙක් අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් සුලෙයිමන් ජේ.අල්. හර්බිෂ් මහතා 2012 ඔක්තෝබර් 7 - 9 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදී.

## 2013 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති සඳහා මැදපෙරදිග කලාපීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් විදේශ මුල්‍ය ඒකරාශී කිරීමට අවශ්‍ය මුලික කටයුතු 2012 වසරේ සිදු කරන ලදි.

| ව්‍යාපෘතිය | සංවර්ධන පාර්ශ්වකරු | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|---|
| ජාතික මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා නවීකරණ ව්‍යාපෘතිය. | අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වු කුවේට් අරමුදල | 36 |
| කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය | අන්තර් ජාතික සංවර්ධනය සඳහා වු OPEC අරමුදල | 50 |
| බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | අන්තර් ජාතික සංවර්ධනය සඳහා වු OPEC අරමුදල | 17 |

# සාර්ක් කලාපයේ රටවල්

## ඉන්දියාව


ඉන්දියාව, ණය හා ප්‍රදාන ස්වරූපයෙන් ශ්‍රී ලංකාවට නිල සංවර්ධන සහායන් ලබා දෙයි. ණය ආධාර ඉන්දියාවේ ආනයන අපනයන බැංකුව මඟින් (EXIM) ලබා දෙනු ලබන අතර ප්‍රදාන ඉන්දියානු රජය මඟින් සෘජුවම ලබා දේ.

## 2012 වසරේ එළඹි එකඟතා


පසුගිය වසර පහක කාලපරිච්ඡේදය තුළ ඉන්දියාව ඇ.ඩො. මිලියන 1,448ක මුදලක් ණය හා ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාවට ලබාදීමට එකඟතාවය පල කර ඇත. 2012 වසරේදී ඉන්දියාව මෙරටට ලබා දීමට එකඟ වු ණය හා ප්‍රදාන මුදල ඇ.ඩො. මිලියන 700.4 ක් වු අතර මෙය එක් වර්ෂයක් තුළ එළඹි වැඩිම වටිනාකමින් යුක්ත එකඟතාවයක් ලෙස වාර්තා වේ. එය 2008 - 2012 අතර කාලයේ එළඹි මුළු එකඟතාවයන්ගෙන් සියයට 48කි. මින් ඇ.ඩො. මිලියන 257.28ක් මුල්‍යයමය ප්‍රදාන ලෙස උතුර, නැගෙනහිර, ඌව හා මධ්‍යම පළාත් වල නිවාස ඒකක 49,000ක් ගොඩනැගීම සඳහා ලැබුනු අතර ණය ආධාර වශයෙන් ලැබූ මුදල ඇ.ඩො. මිලියන 382.37 කි. ඉන් ඇ.ඩො. මිලියන 60.39ක් උතුරු දුම්රිය මාර්ග සේවාව ස්ථාපිත කිරීම සඳහාත් ඇ.ඩො. මිලියන 60.69ක් විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘති - I සඳහාත් ලබා දී ඇත. යුද්ධයෙන් හානියට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීම, අභ්‍යන්තරිකව අවතැන් වු ජනතාව නැවත පදිංචි කිරීම හා විනාශ වු යටිතල පහසුකම් යළි ගොඩනැගීම වැනි මෙරට සංවර්ධන ප්‍රමුඛතා ඉන්දීය සංවර්ධන සහයෝගීතාවයන් සඳහාද පදනම් වි ඇත.

## ආංශීය එකඟතා 2008-2012

2008 - 2012 කාලපරිච්ඡේදය තුළ ඉන්දීය රජය මෙරටට ලබා දීමට එකඟතාව පළ කල වැඩිම වටිනාකමින් යුක්ත ණය ලෙස වාර්තා වන්නේ දුම්රිය අංශ සංවර්ධනය සඳහා ලබා දුන් ඇ.ඩො. මිලියන 966යි. ජීවනෝපාය සංවර්ධනය සඳහා ඇ.ඩො. මිලියන 288ක් ලබා දීමට එකඟවී ඇත. ජල සම්පාදන සංවර්ධන සඳහා එකඟ වු මුදල ඇ.ඩො. මිලියන 60.7ක් විය. පසුගිය වසර පහක කාලපරිච්ඡේදය තුළ ඉන්දීය සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 578.95කි. මින් 2012 වසරේ මුළු උපයෝජනය ඇ.ඩො. මිලියන 294.93ක් විය. ඉන් උතුරු පළාතේ දුම්රිය සේවා ප්‍රතිසංස්කරණය සඳහා වූ උපයෝජනය ඇ.ඩො. මිලියන 91.8කි.




එකඟතා හා උපයෝජන 2008-2012 (ඇ.ඩො. මිලියන)



## 2012 වර්ෂය තුළ අවසන් කරන ලද ව්‍යාපෘති

සහනදායී ණය පදනමෙන් ඇ.ඩො. මිලියන 167.4ක් ලැබූ දක්ෂිණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය 2012 වසරේ සාර්ථකව නිම කරන ලදි.

## 2012 තුළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ඇති වූ අවබෝධතා ගිවිසුම්

| අවබෝධතා ගිවිසුම | දිනය හා ස්ථානය | අමාත්‍යාංශය හා ආයතනය |
|---|---|---|
| කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාවය සඳහා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම | 2012 ජනවාරි 17 දින කොළඹ | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| උතුරු, නැගෙනහිර, ඌව හා මධ්‍යම පළාත්වල නිවාස ඒකක 49,000ක් සඳහා ඉන්දීය මූල්‍යමය ආධාර සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීම සඳහා | 2012 ජනවාරි 17 දින කොළඹ | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| ශ්‍රී ලංකාවේ විදුලි සංදේශන නියාමන කොමිසම හා ඉන්දියාවේ විදුලි සංදේශ නියාමන අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුම | 2012 ජනවාරි 17 දින කොළඹ | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය |
| රාජ්‍ය නොවන සංවිධාන, පුණ්‍යාධාර ආයතන, අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන හරහා ක්‍රියාත්මක වන සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය මූල්‍යාධාර සහයෝගීතාවය සඳහා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම | 2012 ජුනි 09 දින නවදිල්ලිය | |
| ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ විදුලි ජාලවල අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය හා ඉන්දියාවේ බලශක්ති ජාල සමාගම අතර අවබෝධතා ගිවිසුම | 2012 ජුනි 09 දින නවදිල්ලිය | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය |
| දණ්ඩනය නියම වූ පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම | 2012 ජුනි 09 දින නවදිල්ලිය | පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |

# ද්විපාර්ශ්වීය නැගෙනහිර අංශය


## චීනය

ශ්‍රී ලංකා රජය ප්‍රදාන සහ ණය ස්වරූපයෙන් චීනය වෙතින් මූල්‍යාධාර ලබාගනී. ප්‍රදාන මෙන්ම පොලී රහිත ණය චීන රජය වෙතින් දෙනු ලබන අතර චීන ආනයන - අපනයන බැංකුව (EXIM), චීන සංවර්ධන බැංකුව (CDB) සහ චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC) වෙතින් ණය ලබාදේ.

2008-2012 දක්වා වූ පසුගිය වසර 5 තුළ චීනයෙන් කරන ලද මුළු එකඟතාවය ඇ.ඩො. මිලියන 3,609ක් විය. පසුගිය වසර 5ක කාලය තුළ සිදුකරන ලද මුළු එකඟතාවයෙන් ඉහළම එකඟතාවය 2009 වසරේ දී සිදුකර ඇත. එය ඇ.ඩො. මිලියන 1206ක් වූ අතර එයට සමගාමීව පිළිවෙළින් 2012 සහ 2010 වර්ෂ වලදී ඇ.ඩො. මිලියන 1056 හා 829ක එකඟතාවයන් සිදු කර ඇත. මෙම මුදලින් චීන ආනයන අපනයන බැංකුව විසින් හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා ද නැගෙනහිර පළාතේ ආලෝකකරණය සම්බන්ධ මූල්‍ය දායකත්වය ලබා දී ඇති අතර, චීන සංවර්ධන බැංකුව විසින් මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය සඳහා එකඟතාවයක් ද සිදු කරන ලදී.


පසුගිය වර්ෂ පහක කාලයේ දී චීනයෙන් කරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 2,514ක් විය. මෙයින්, 2012 වසරේදී සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 868.19ක් විය. 2012 වසරේ දී සිදුකරන ලද උපයෝජනයෙන් ඉහළම උපයෝජනය වන ඇ.ඩො මිලියන 345ක මුදල මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකිරීම සඳහා විය. තවද දුම්රිය බලවේග කට්ටල සැපයීම හා හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කරන ලද උපයෝජනයන් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 177ක් සහ ඇ.ඩො. මිලියන 162ක් විය.

2008 සිට 2012 දක්වා එකඟතා සහ උපයෝජනයන් (ඇ.ඩො.මිලියන)




### ආංශික ව්‍යාප්තිය

පසුගිය වසර පහක කාලය තුළ චීනයේ සහාය ප්‍රධාන වශයෙන්ම ලබා ගන්නා ලද්දේ මාර්ග හා පාලම්, විදුලිබල හා බලශක්ති සහ වරාය හා ගුවන්සේවා යන අංශයන් සංවර්ධනය කිරීම සඳහාය. 2012 වසර අවසානයේ දී චීනය වෙතින් අරමුදල් යොදවන ලද සමස්ත ව්‍යාපෘති ගත මුළු මුදල ඇ.ඩො. මිලියන 3,876ක් විය. මෙම මුදලින්, ඉහළම අගය මාර්ග හා පාලම් අංශයේ සංවර්ධනය සඳහා ආයෝජනයට ගන්නා ලදී. එම අගය ඇ.ඩො. මිලියන 1,565ක් වන අතර එය චීනය වෙතින් ලබාදී ඇති සමස්ත මුළු මුදලෙන් සියයට 40ක අගයකි. 2012 වසර අවසානය වන විට චීනය වෙතින් ලබාදෙන ලද සමස්ත මුළු මුදලෙන් දෙවන විශාලතම මුදල විදුලිබල හා බලශක්ති අංශයේ සංවර්ධනය සඳහා වූ අතර එය සමස්ත මුදලින් සියයට 31ක අගයක් ගනී. තවද, වරාය හා ගුවන්සේවා අංශ සඳහා ආයෝජනය ආසන්න වශයෙන් සියයට 23ක අගයක් ගනියි.




## 2012 වසර තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති

- නැගෙනහිර පළාතේ ආලෝකකරණය සඳහා වන මූල්‍ය දායකත්වය
- හම්බන්තොට වරාය සංවර්ධනය - අදියර II

# කොරියාව

කොරියානු රජය ප්‍රදාන හා ණය මගින් ශ්‍රී ලංකාවේ සංවර්ධන සඳහා සහාය ලබාදෙයි. කොරියානු අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය (KOICA) ප්‍රදානයන් ලබාදෙනු ලබන අතර කොරියාවේ ආනයන - අපනයන බැංකුව යටතේ ක්‍රියාත්මක ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (Economic Development Cooperation Fund) මඟින් විදේශ ණය ආධාර ලබාදෙනු ලැබේ.

2012 වසරේදී කොරියානු රජයෙන් විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා එකඟත්වය ඇති කර ගත් ව්‍යාපෘතිවල මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 19.9ක් වන අතර 2012 වසරේදී සිදුකරන ලද සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 47.2කි. 2012 වසරේ කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යටතේ ලබා දෙන ලද ආධාර උපයෝගී කොටගෙන මූල්‍යයනය කරන ලද ව්‍යාපෘති අතර මාර්ග සංවර්ධනය, ජල සම්පාදන කටයුතු හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණයන් සම්බන්ධ ව්‍යාපෘති ප්‍රධාන තැනක් ගනී. ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල මගින් විශේෂයෙන්ම 2009 - 2012 වසර කිහිපය තුළදී ලබාදෙන මූල්‍යාධාරවල විශේෂ ලක්ෂණය වනුයේ පොලී අනුපාතය බොහෝ සහනදායී අනුපාතයක වීමත් 2000 මුල් භාගය හා සසඳන විට ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ වීමත්ය. වර්තමානයේදී එම ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය සියයට 0.15ක් වන අතර ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල විසින් ලබා දෙන ණය නැවත ගෙවිය යුතු කාලය වසර 10ක සහන කාලයක් සහිත වසර 40ක් දක්වා වේ.

තෙවන කාර්යරාමු එකඟතාවය 2012 වසරේදී අත්සන් කරන ලද අතර එහිදී ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල යටතේ 2012-2015 කාලපරිච්ඡේදය සඳහා ඇ.ඩො. මිලියන 290ක් දක්වා මූල්‍යාධාර ලබා ගැනීමට හැකියාව ඇත. ඒ අනුව, ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම් සපයන ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 33.5ක් සහ ඇ.ඩො. මිලියන 26ක් වන කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ තාක්ෂණික විද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘතීන් සඳහා උපයෝජනය කිරීමට අවශ්‍ය පියවරයන් 2012 වසරේදී ගනු ලැබිණි. ඒ අනුව 2012-2015 කාලපරිච්ඡේදය සඳහා වූ තෙවන කාර්යරාමු එකඟතාවයේදී එකඟ වූ පරිදි ඇ.ඩො. මිලියන 290න් ඇ.ඩො. මිලියන 59.5ක් උපයෝජනය සඳහා 2012 වසරේදී අවශ්‍ය මූලික කටයුතු සිදුකරන ලදී. එසේම අනුරාධපුර-පාදෙණිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද පරිපූරක ණයක් ලෙස ඇ.ඩො. මිලියන 11.8කට සමාන මුදලක් මූල්‍යයනය කිරීම සඳහා 2012 වසරේදී එකඟතාවයක් ඇති කර ගන්නා ලදී.

කොරියාවේ සංවර්ධන අත්දැකීම් හුවමාරු කරගැනීම හා එමගින් රටේ සමාජ-ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කොරියාවේ උපාය මාර්ගික හා මුදල් අමාත්‍යාංශය 2011 වසරේදී, "දැනුම බෙදා හැරීමේ වැඩසටහන" (Knowledge Sharing Programme) හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහනට අනුව, අදාළ රාජ්‍ය අමාත්‍යාංශයන් සහ ඒ හා බැඳුනු විවිධ රාජ්‍ය ආයතනයන් නියෝජනය කරමින් රාජ්‍ය නිලධාරීන් 23ක් සඳහා 2012 වසරේ, මෙම අගනා අවස්ථාව ලද අතර, ඔවුන්ට සෘජු විදේශ ආයෝජන හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ තරගකාරිත්වය නංවාලීම, කර්මාන්ත ඇති කිරීමේ ප්‍රතිපත්ති, නැගී එන මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන් ඔස්සේ පුරා සතියක අධ්‍යයන කාලයක් ලබාදෙන ලදී.

# 2012 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘති

## අනුරාධපුර - පාදෙණිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ පාදෙණිය සහ අනුරාධපුරය අතර කඩිනම් ප්‍රවාහන සේවාවක් සැපයීමයි.

මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ක්‍රීට් ඇතිරූ පටු මං තීරු 2ක් හා අමතරව නගර මධ්‍යයේ පටු මං තීරු 4ක් සහිතව පාදෙණිය අනුරාධපුර මාර්ගය දිගින් කිලෝමීටර් 80.8 කින් හා පළල මීටර් 14.0ක් සහිතව පුළුල් කිරීමේ හා සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත්ය. ඇස්තමේන්තු ගත වියදම වූ ඇ.ඩො. මිලියන 70 න්, ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල හරහා කොරියාවේ අපනයන-ආනයන බැංකුව විසින් ඇ.ඩො. මිලියන 55ක සහනදායී කොන්දේසි මත සපයනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ ඍජු හා වක්‍ර ප්‍රතිඵල මඟින් ප්‍රවාහන කාලය කෙටි කිරීමටත්, වාහන මෙහෙයුම් පිරිවැය අඩුකිරීමටත්, රථවාහන අනතුරු අඩුකිරීමටත් හා පොදු ප්‍රවාහන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි කිරීමටත් අපේක්ෂා කරන අතර කලාප අතර මඟී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීමටද අපේක්ෂා කෙරේ.

2010 ඔක්තෝම්බර් සිට 2011 පෙබරවාරි දක්වා ඇති වූ අනපේක්ෂිත මහ වැසි හේතු කරගෙන ව්‍යාපෘති ප්‍රදේශයේ මාර්ග වලින් කොටසක් හානි වී හා තත්ත්වය බාල වී තිබුනි. මෙම හානි හේතුවෙන් වූ ව්‍යාපෘතියේ අමතර කටයුතු සඳහා ඇ.ඩො. මිලියන 13ක් වැය වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබිණි. ව්‍යාපෘතියේ එම අතිරේක වියදම් සඳහා ලබා ගත් ණය මූලාශ්‍ර ප්‍රමාණවත් නොවීම මත ආර්ථික සංවර්ධන අරමුදල හරහා පරිපූරක ණය මුදලක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කරන ලදී.

ඒ අනුව ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල විසින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම සඳහා ඇ.ඩො. මිලියන 11.13 කට සමාන මුදලක් කොරියානු වොන් වලින් පරිපූරක ණයක් ලෙස 2012 වසරේදී ලබා දුනි. 2012 දෙසැම්බර් අග භාගය වන විට මෙම ව්‍යාපෘතියේ සියයට 98ක් සම්පූර්ණ කර තිබුනි.

## රුහුණුපුර ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය

පළාතේ වෙසෙන ජනතාවගේ ආර්ථික, සෞඛ්‍ය ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ මූලික පරමාර්ථය ඇතිව, රටේ දකුණු පළාත සංවර්ධනය කිරීමට ජාතික ප්‍රතිපත්ති සැලසුම අනුව අපේක්ෂිතය. නැගෙනහිර හා බස්නාහිර යා කෙරෙන වැදගත් යාත්‍රණ මාර්ගයක් පිහිටීම හේතුවෙන් වරාය ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා විශාල ශක්‍යතාවක් ඇතැයි හඳුනාගෙන ඇති හම්බන්තොට වරාය ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීමට මෙම රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතියෙන් බලාපොරොත්තුවේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වන්නේ ව්‍යාපෘති ප්‍රදේශයේ ජල සැපයුම් පද්ධතිය සංවර්ධනය කිරීම හා සුරක්ෂිත හා විශ්වාසදායී ජල සම්පාදනය හරහා රුහුණුපුර සංවර්ධන සැලැස්ම සුමට හා කාලීන ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීමටත් ව්‍යාපෘති ප්‍රදේශයේ කාර්මික සංවර්ධනයට හා ආර්ථික වර්ධනය උදෙසා දායක වීමයි.

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වන්නේ ජල මූලාශ්‍ර වැඩිදියුණු කිරීම සහ රිදීගම වැවේ ජල ප්‍රවේශයන් ඉදිකිරීම, ඝන මීටර 17,500ක පවිත්‍රාගාරයක් කොග්ගල ඉදිකිරීම, ගොඩබිම් ජලාශ 4ක් හා උස් ජල කුළුණු 4ක් ඉදිකිරීම සහ කිලෝමීටර 4ක දිගින් යුතු බෙදාහැරීමේ නල පද්ධතියක් සැපයීමත් වේ.

ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ඇ.ඩො. මිලියන 115.7කි. ඉන් ඇ.ඩො. මිලියන 76.3ක් කොරියානු රජය විසින් ලබාදෙනු ඇත. මෙම ව්‍යාපෘතිය 2013 වසර අගභාගයේ සම්පූර්ණ කිරීමට නියමිතය.

# වසරේ ක්‍රියාත්මක වීමට නියමිත වූ ප්‍රධාන ව්‍යාපෘති

- කුරුණෑගල මහ නගර සීමාවේ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය (දැදුරු ඔය) - ඇ.ඩො. මිලියන 67.3
- රුවන්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය - ඇ.ඩො. මිලියන 24
- ගම්පහ පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 25
- උතුරු පළාත් සභා කාර්යාල සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 20

# ද්විපාර්ශ්වීය බටහිර අංශය


ශ්‍රී ලංකාව වෙත බටහිර අර්ධගෝලීය රටවලින් ගලා එන නිල සංවර්ධන සහයන් ලබා ගැනීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ද්විපාර්ශ්වීය නැගෙනහිර අංශය මගින් ඉටුකරයි. මේ අනුව ලංකාවට මුල්‍ය සහයන් ලබදෙන බටහිර පාර්ශ්වකරුවන් වන්නේ ජර්මනිය, නෙදර්ලන්තය, ස්විඩනය, යුරෝපා සංගමය, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, බෙල්ජියම, රුසියාව, ඔස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය සහ හංගේරියාවයි.

2010 වසරේදී ශ්‍රී ලංකාව මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමග බටහිර රටවලින් සහ ණය දෙන ආයතන විසින් ලබා දෙනු ලබන ණයවල සංයුතිය සහ ස්වරූපය සැලකියයුතු වෙනසකට භාජනය විය. අඩු පොලී අනුපාතයක් සහිත සහනදායී ණය ලබාදීම පහත වැටීම හේතු කොටගෙන මෙම රටවලින් සහ ආයතනවලින් ලබාගන්නා සංවර්ධන සහයන් අපනයන ණය, සහනදායී නොවන ණය, සහ සහනදායී ණය යන ප්‍රභවයන්ගෙන් සම්මිශ්‍රණයකින් ලබා ගැනීමේ තත්ත්වයට පත්විය. අපනයන ණය පහසුකම් යටතේ ලබාගන්නා විදේශ මුල්‍යයන්, ණය නැවත ගෙවීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ සහ ආදායම් ජනනය කළහැකි වාණිජමය ශක්‍යතාවක් ඇති ව්‍යාපෘතිවල ආයෝජනය කරන ලදි. මේ අනුව බටහිර රටවලින් ගනු ලැබූ බොහොමයක් ණය මහාමාර්ග ඉදිකිරීම, පාලම් ඉදිකිරීම, පානීය ජල සැපයුම සහ ගුණාත්මක හා තාක්ෂණයෙන් උසස් සෞඛ්‍ය සේවාවක් මහජනතාව වෙත ලබාදීම සඳහා වන රෝහල් සංවර්ධනය කිරීම හා සෞඛ්‍ය සේවාවන් දියුණුකිරීම වැනි සමාජ යටිතල පහසුකම්වල උපයෝජනය කරන ලදි.

මෙම ණය මූලික වශයෙන් i. අපනයන ණය ii. වාණිජ ණය iii.සාම්ප්‍රදායි ණය ආධාර iv. ආපසු නොගෙවන ප්‍රදාන යන මාදිලියන්ගෙන් ලාබාගන්නා ලදි.

2011 වර්ෂය සමග සසඳා බලන විට දියුණු ආර්ථිකයන්හි මූල්‍ය එකඟතා හා උපයෝජන සංරචකයන් 2012 වසර තුළ දී පිළිවෙළින් සියයට 88න් හා සියයට 19න් වැඩි වී ඇත. මෙම ප්‍රවණතාව සඳහා ප්‍රධානතම හේතු සාධකය වන්නේ අදාළ කාලය තුල පවත්නා වාසිදායක මුල්‍ය කොන්දේසි සමඟ අඩු වියදම් මුල්‍ය ප්‍රභවයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා සම්බන්ධ රජයේ ආයතන මෙහෙයවමින් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන විචක්ෂණශීලී හා නම්‍යශීලි විදේශ ණය මුල්‍යකරණ උපාය මාර්ග වේ. බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන් වැනි සහනදායී ණය ප්‍රභව වෙතින් සහනශීලී ණය පහසුකම් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සීමා වීම ද බටහිර රටවල්හි මූල්‍ය එකඟතා වැඩි වීමට හේතු වී ඇත.

මුල්‍ය එකඟතා හා උපයෝජන 2005-2012 (ඇ.ඩො. මිලියන)




| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| එකඟතා | 513 | 396 | 337 | 439 | 138 | 442 | 124 | 229 | 2,618 |
| උපයෝජන | 186 | 278 | 264 | 318 | 295 | 345 | 166 | 168 | 2,015 |

## 2012 වසරේ මුල්‍යමය එකඟතා

වාණිජමය හා අපනයන ණය පහසුකම් යටතේ 2012 වසරේදී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|---|
| ප්‍රංශය | ජාතික මාර්ග ජාලයේ පාලම් 46ක් ඉදිකිරීම හා පුළුල් කිරීම | 28.0 |
| නෙදර්ලන්තය | හම්බන්තොට මහ රෝහල සංවර්ධනය | 55.5 |
| නෙදර්ලන්තය | නුවරඑළිය මහ රෝහල සංවර්ධනය | 46.9 |
| ජර්මනිය | මහ මෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ කටයුතු නිමා කිරීම | 34.4 |
| ස්පාඤ්ඤය | වේයන්ගොඩ දුම්රිය හරස් මාර්ගය හරහා ගුවන් පාලම ඉදිකිරීම | 14.2 |
| එක්සත් රාජධානිය (HSBC) | ග්‍රාමීය පාලම් 210 ඉදි කිරීම | 44.0 |
| ජර්මනිය (GIZ ප්‍රදාන ආධාර) | ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වෘත්තීය පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම | 5.3 |
| ඇමරිකා එක්සත් ජනපද (USAID ප්‍රදාන) | සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීමේ වැඩසටහන | 1.4 |
| ඇමරිකා එක්සත් ජනපද රජය (USAID ප්‍රදාන) | සමතුලිත ආර්ථික වර්ධන වැඩසටහන | 3.7 |
| ජර්මනිය (GIZ ප්‍රදාන) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | 0.3 |
| | **එකතුව** | **233.7** |

## 2012 වසරේදී සම්මුති සාකච්ඡා නිමකරන ලද ප්‍රධාන ව්‍යාපෘති

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|---|
| නෙදර්ලන්තය (අපණයන ණය) | නෙදර්ලන්ත මූල්‍යාධාර යටතේ නවීනතම තාක්ෂණය උපයෝගි කර කරමින් ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලයන සේවය වැඩිදියුණු කිරීම | 32.64 |
| | සෞඛ්‍ය අමාත්‍යංශයේ ජාතික රුධිර පාරවිලයන සේවාව යටතේ පර්යන්ත ලේ බැංකු ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම | 24.23 |
| ස්පාඤ්ඤය (අපණයන ණය) | විසල් රත්නපුර ජල සම්පාදනය යෝජනා ක්‍රමය අදියර I | 28.73 |
| ඔස්ට්‍රියාව | ශ්‍රී ලංකාවේ ජාතික රෝහලේ හෘද රෝග ඒකකය සඳහා හෘද කැතීටරකරණ පද්ධති 2ක් හා හෘද ස්පන්දන අනුනාද යන්ත්‍ර 2ක් සැපයීම, සවි කිරීම, යෙදවීම පරීක්ෂා කිරීම හා පුහුණු කරවීම. | 2.92 |
| | මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය | 12.79 |
| | උසස් තාක්ෂණ ආයතනය වැඩි දියුණු කිරීම - මහනුවර | 9.20 |
| ජර්මනිය GIZ ප්‍රදාන | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | 3.69 |
| HSBC ඩෙන්මාර්කය අපනයන ණය | සී/ස MILCO පුද්ගලික සමාගමේ මෙහෙයුම් කර්මාන්තශාලා නවීකරණය | 45.00 |
| යුරෝපියානු අයෝජන බැංකුව (EIB Bank) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ හරිත බලශක්ති අංශයන් ගෝලීයකරණය | 110.70 |

## 2012 වසර තුළ ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති

### ග්‍රාමීය වානේ පාලම් 210 ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ, මුළු රටම ආවරණය කරමින් මීටර 6 සිට 30 දක්වා විවිධ දිගින් යුතු ස්ථාවර වානේ පාලම් 210ක් ඉදිකිරීම සිදු කරනු ලබයි. ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා එක්සත් රාජධානියේ HSBC බැංකුව සමඟ මහා බ්‍රිතාන්‍ය පවුම් මිලියන 28ක ණය පහසුකමක් ලබා ගැනීම සඳහා වන ගිවිසුම 2012 වසරේදී අත්සන් කරන ලදි. දුෂ්කර ප්‍රදේශ වෙත ප්‍රවේශ පහසුකම් වඩාත් පුළුල් කිරීම තුලින් රටේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය පහසුකම් සලසනු ඇත. එමගින් ග්‍රාමීය ප්‍රජාව විශාල ලෙස ප්‍රතිලාභ ලබනු ඇති අතර ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් වැඩි දියුණු කර ගැනීම සඳහා ඔවුන් හට වඩා හොඳ අවස්ථාවන් ලැබෙනු ඇත. 2013 වසරේ මුල් භාගය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

### දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය

දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යුරෝ මිලියන 59ක මූල්‍යාධාර මත 2008 වසරේදී ආරම්භ කරන ලදි. ව්‍යාපෘතියේ සමස්ත වියදමෙන් යුරෝ මිලියන 17.3ක් "සංවර්ධන සඳහා වූ අපනයන ගනුදෙනු වැඩසටහන" (ORET) යටතේ ප්‍රදානයක් ලෙස සපයා ඇත. ඉතිරි මුදල වන යුරෝ 33,748,740ක මුදල සී/ස හොංකොං හා ෂැංහයි බැංකු සමාගම (HSBC) විසින් අපනයන ණයක් ලෙස ලබා දෙන ලදි. අමතර වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් යුරෝ මිලියන 8ක පමණ දායකත්වයක් මෙම ව්‍යාපෘතියට දක්වා ඇත.

යෝජිත ධීවර වරාය බෝට්ටු නතර කිරීම සඳහා මීටර 2.3ක උපරිම ගැඹුරකින් හා මීටර 1150ක දිගැති නැංගුරම් පහසුකම් වලින් සමන්විත විවිධ ප්‍රමාණවල ධීවර බෝට්ටු 490ක් රැඳවීමේ පහසුකම් වලින් යුත් ගල් ආස්තරිත දියකඩනයකින් අහුරන ලද මීටර 1100ක දියකඩනයකින් යුත් හෙක්ටාර 13ක වරාය ප්‍රදේශයකින් සමන්විත වනු ඇත. මාළු භාර ගැනීමට, පිරිසිදු

කිරීමට හා වෙන්දේසි කිරීමට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම්, ශීත ගබඩා, අයිස් මිදවීම් පහසුකම් හා ශීතාගාර, ගොඩනැගිලි, ධීවර කටයුතු හා සම්බන්ධ වෙනත් ගොඩනැගිලි, නැව් අලුත්වැඩියා කිරීම හා උපයෝගිතාවය වෙනුවෙන් බෑවුම් මාර්ග පහසුකම්ද එහි සමන්විත වනු ඇත.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහල යාම හා රටේ ධීවර නිෂ්පාදන අපනයනය පුළුල් කිරීම සඳහා දායකත්වය ලැබෙනු ඇති අතර, දීර්ඝ කාලීනව ව්‍යාපෘතිය මගින් ධීවර පවුල් රාශියකට ප්‍රතිලාභ හිමිවනු ඇත. තවද, දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් අවධිය අතරතුරදී නිර්මාණය වන රැකියා අවස්ථා ප්‍රදේශවාසීන් වෙත ප්‍රමුඛතා පදනමකින් යුතුව පිරිනැමෙනු ඇත. දකුණු ආසියාවේ විශාලතම ධීවර වරාය දික්ඕවිට ධීවර වරාය බවට වාර්තා වේ.

## ජාතික මාර්ග ජාලයේ පාලම් 46ක් නැවත ඉදිකිරීම

ජාතික මාර්ග ජාලයේ බස්නාහිර, දකුණ, ඌව, සබරගමුව, මධ්‍යම හා වයඹ පළාත්වල අබලන් හා පටු පාලම් 46ක් ප්‍රතිස්ථාපනය හා නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සදහා යුරෝ මිලියන 22ක ණය මුදලක් ප්‍රංශ රජයෙන් ලබා ගැනීම වෙනුවෙන් වූ ගිවිසුමට 2012 වසරේදී එළැඹෙන ලදි. වාහන තදබදය ලිහිල් කිරීම තුළින් වාහන අනතුරු අඩු කිරීමටත්, මාර්ග ජාලය අතර සම්බන්ධතාව වර්ධනය කිරීමටත්, ව්‍යුහාත්මකව අබලන් හා පටු පාලම් ප්‍රතිස්ථාපනය සහාය වනු ඇත.

## හම්බන්තොට හා නුවරඑළිය මහ රෝහල් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම

යුරෝ මිලියන 78ක නෙදර්ලන්ත අපනයන ණය පහසුකම් යටතේ හම්බන්තොට හා නුවරඑළිය මහ රෝහල් සංවර්ධන ව්‍යාපෘති 2012 වසරේදී ආරම්භ කරන ලදි. නවීන වෛද්‍ය උපකරණ හා වෙනත් සෞඛ්‍යාරක්ෂණ පහසුකම් සහිත ඇඳන් 800කින් හා මහල් 9කින් යුත් හම්බන්තොට නව රෝහල ඉදිකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හම්බන්තොට හා අනෙකුත් සමීප ප්‍රදේශවල ජීවත්වන 675,000ක් පමණ වන ජනතාවට ඉහළ ගුණාත්මක තත්ත්වයේ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව ලැබෙනු ඇත. ඇඳන් 600කින් හා මහල් 4කින් යුත් නවීන වෛද්‍ය උපකරණ සහ සෙසු පහසුකම්වලින් සමන්විත නුවරඑළිය මහ රෝහල, කදුරට ප්‍රදේශයේ ජීවත්වන 700,000ට ආසන්න ජනතාවකට සෞඛ්‍ය පහසුකම් සලසනු ඇත.

# මානව සම්පත් සංවර්ධන සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන අංශය

## එක්සත් ජාතීන්ගේ සංවිධාන අංශය

එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), ලෝක ආහාර වැඩසටහන (WFP), එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA), සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (UNHCR), එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-HABITAT) සහ අන්තර් ජාතික කම්කරු සංවිධානය (ILO) වැනි නියෝජිතායතන සමඟ ශ්‍රී ලංකා රජය එලදායි සම්බන්ධතාවයක් ගොඩ නගාගෙන ඇත. එක්සත් ජාතීන්ගේ අධාර ශ්‍රී ලංකාවට ප්‍රධාන වශයෙන්ම ප්‍රදාන ස්වරූපයෙන් ලැබෙන අතර කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල මඟින් විදේශ මූල්‍යයනය ලබාගනු ලබන්නේ සහනදායී ණය වශයෙනි.

සෑම වසර පහක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ අපේක්ෂිත ව්‍යාපෘතීන් සාමූහිකව තීරණය කරනු ලබන අතර, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව යටතේ හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හි ආයෝජනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව (UNDAF) පිළියෙල කරනු ලබයි. ඒ අනුව, රජයේ සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූලව එක්සත් ජාතීන්ගේ සහාය ලබා දෙන ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායික නියමයන් ලබා දෙමින් 2013-2017 කාලපරිච්ඡේදය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව (UNDAF) සඳහා ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් 2012 ඔක්තෝබර් මසදී අත්සන් තබන ලදී.

## 2012 වසරේ ඒකාග්‍රතා

2008 - 2012 කාලපරිච්ඡේදය සඳහා වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව මත පදනම්ව කෘෂිකර්මය, අධ්‍යාපන, පරිසරය, ආපදා සහන, ජලය, ග්‍රාමීය සහ ජීවනෝපාය සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන්හි කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතු ප්‍රමුඛ ව්‍යාපෘතීන් සහ වැඩසටහන් හඳුනා ගෙන ඇත. ඒ අනුව, 2012 වසරේ දී පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා වන ගිවිසුම්වලට එළඹීමට ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමත් විය. 2012 වසරේදී ලෝක ආහාර වැඩසටහන විසින් සිදු කරන ලද සමස්ත ඒකාග්‍රතාවය ඇ.ඩො. මිලියන 27.96ක් වන අතර එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල එම වසරේ සිදු කරන ලද සමස්ත ඒකාග්‍රතාවය ඇ.ඩො. මිලියන 26කි.


**වසරේ ඒකාග්‍රතා (ඇ.ඩො. මිලියන)**

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | වැලිගම පොල් කොළ මැලවීමේ සහ කුණුවීමේ රෝගය ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ වැඩසටහන | 0.30 |
| | කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි වාරි සහ කෘෂි ක්ෂේත්‍රයන්හි ජීවන තත්ත්ව සංවර්ධනය කිරීමේ වැඩසටහන | 5.10 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ ආහාර හා කෘෂිකර්ම සංවිධානය / ලෝක පරිසර වැඩසටහන | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණමඩු වාරි සංවර්ධන ව්‍යාපෘතිය | 22.20 |
| ලෝක ආහාර වැඩසටහන | දිගු කාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන | 27.96 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | ප්‍රජා වන වැඩසටහන | 4.79 |
| සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් | ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ආධාර ලබා දීම | 0.08 |

## 2012 වසරේ උපයෝජනයන්

පහත රූප සටහනින් දක්වා ඇති පරිදි, 2012 වසරේදී සිදු කරන ලද ඉහළම උපයෝජනය වන සියයට 39.5 වාර්තා වී ඇත්තේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘති සඳහාය. දෙවන ඉහළම උපයෝජනය වන සියයට 24.6 අන්තර්ජාතික කෘෂිකර්ම අරමුදල විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතිවලින් වාර්තා විය. 2012 වසරේදී ලෝක ආහර වැඩසටහන විසින් මූල්‍යයනය කරන ලද ව්‍යාපෘතිවලින් සියයට 14.6ක උපයෝජනයක් වාර්තා වූ අතර ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් සිදු කරන ලද උපයෝජනයන් පිළිවෙලින් ඇ.ඩො. මිලියන 4.1ක් සහ ඇ.ඩො. මිලියන 3.6ක් විය. සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් විසින් වව්නියාව, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම සහ යාපනය යන දිස්ත්‍රික්කයන්හි සිටින අවතැන්වූවන්හට නිවාස සහනාධාර වශයෙන් ඇ.ඩො. මිලියන 0.4ක් බෙදා දී ඇත.

**2011 වසරේ උපයෝජනයන් (ඇ.ඩො. මිලියන)**



## 2012 වසරේ අවසන් කරන ලද ව්‍යාපෘතීන්

ධීවර, පශු සම්පත්, පාරිසරික හා ජීවන තත්ත්ව සංවර්ධන යන ක්ෂේත්‍රයන් හි පහත සඳහන් ප්‍රමුඛ ව්‍යාපෘතීන් 2012 වසරේදී අවසන් කිරීමට හැකි විය.

**2012 වසරේ අවසන් කරන ලද ව්‍යාපෘතීන්**

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො.මිලියන |
|---|---|---|
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | උතුරු පළාත තුළ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන තත්ත්ව සංවර්ධනය වැඩි දියුණු කිරීම | 2.03 |
| | උතුරු පළාතේ නැවත පැමිණෙන අවතැන් වුවන් හට අත්‍යාවශ්‍ය කෘෂි යෙදවුම් කඩිනමින් ලබාදීම | 6.20 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | සහයෝගීතාවය මඟින් ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණය කිරීම | 1.50 |
| | දේශීය යහපාලන වැඩසටහන | 1.80 |
| | ඕසෝන් ස්ථරයට හානි කරන ද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධයෙන් වගකියන ආයතන ශක්තිමත් කිරීම | 1.40 |
| | දූෂණයට එරෙහිව ක්‍රියාවන් සහ පරිශ්‍රමය සඳහා සහයෝගය දැක්වීම | 0.10 |
| | දකුණු දකුණු සහයෝගීතා වැඩසටහන | 0.20 |

## ශ්‍රී ලංකාවෙන් සෝමාලියාවට සහ නැගෙනහිර අප්‍රිකාවට සහල් පරිත්‍යාගයක්

ලෝක ආහාර සංවිධානයට ලබා දුන් පළමු වන සහල් පරිත්‍යාගය සනිටුහන් කරමින් ශ්‍රී ලංකා රජය සෝමාලියාවේ සහ නැගෙනහිර අප්‍රිකාවේ නියඟයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් සහල් මෙ.ටො. 10,000ක ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ කටයුතු කරන ලෝක ආහාර සංවිධානය හරහා පරිත්‍යාග කරන ලදී. ඉතියෝපියාවේ කඳවුරුවල සිටින සෝමාලී සරණාගතයින්ගේ අත්‍යාවශ්‍ය ආහාර සහ පෝෂණ අවශ්‍යතා ඉටු කරලීමේ ලෝක ආහාර සංවිධානයේ පරිශ්‍රමයට සහයෝගය දැක්වීමක් ලෙස මෙම පරිත්‍යාගය සිදු කරන ලදී. වෙළඳපළ වටිනාකම ඇ.ඩො. මිලියන 4කට සමාන වූ මෙ.ටො. 500ක සහල් ප්‍රමණයක් සහල් පරිත්‍යාගයේ පළමු නැව් ගත කිරීම ලෙස 2012 මාර්තු මසදී සිදු කරන ලදී.

තවද, ලෝක ආහාර වැඩසටහන මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන දිගුකාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන මෙහෙයුම් ව්‍යාපෘතිය යටතේ පාසැල් සඳහා දිවා ආහාර ලබා දීමේ වැඩසටහනට සහයෝගය ලබා දීම සඳහා රතු සහල් මෙ. ටො. 500ක් ලබා දීමටද ශ්‍රී ලංකා රජය එකඟ වී ඇත.

## 2012 වසරේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් පිළිබඳ සංක්ෂිප්ත සටහන්

### ප්‍රජා වන වැඩසටහන

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජීවත් වන කුඩා පරිමාණ ගොවීන්ට සහාය දැක්වීමට සහ වනාන්තර ආවරණය ඉහළ නැංවීමට 2012 වසරේදී, ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එක්ව ප්‍රජා වන වැඩසටහන ආරම්භ කරන ලදී.

අමතර හෙක්ටයාර 23,000ක වනාන්තර නැවත ඇති කිරීම සහ 90,000කට ආසන්න ග්‍රාමීය ජනතාවගේ ආදායම ඉහළ නැංවීම මෙම වැඩසටහන මඟින් අපේක්ෂා කරනු ලබයි. ඊට අමතරව මෙම වැඩසටහන මඟින් වනාන්තර මත යැපීම අවම කිරීමේ අරමුණ ඇතිව ප්‍රධාන වශයෙන් මී මැසි පාලනය, වී සහ එළවළු වගා කිරීම, පළතුරු වතු පවත්වා ගෙන යාම, ආහාර සැකසීම, අත්කම් නිර්මාණ සහ පශු සම්පත් සංවර්ධනය ආදිය සඳහා සහාය දැක්වීමට ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා ඇ.ඩො. මිලියන 4.79ක ප්‍රදානයක් ඕස්ට්‍රේලියානු ආධාර මඟින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලබා දී ඇත.

## දිගු කාලීන සහන සහ ප්‍රතිෂ්ඨාපන වැඩසටහන

උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි පිහිටි සිය ගම්බිම් කරා යළි පැමිණි සහ පැමිණෙමින් සිටින අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කරන අතරතුර ඔවුන්ගේ ජීවනෝපායන් සහ වත්කම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් දරන්නා වූ ප්‍රයත්නයට සහාය දැක්වීම මෙන්ම එම ජනතාවගේ මානුෂීය සහ කඩිනම් ප්‍රතිෂ්ඨාපන අවශ්‍යතාවයන් ආවරණය කිරීම ඉහත වැඩසටහනෙහි මූලික අරමුණු වේ.

මෙම වැඩසටහනෙහි මුළු පිරිවැය ඇ.ඩො. මිලියන 27ක් වේ. මෙම අරමුදල් උපයෝගී කරගනිමින් උතුරු පළාතේ මන්නාරම, වවුනියාව, මුලතිව්, කිලිනොච්චි සහ යාපනය යන දිස්ත්‍රික්කයන්හි සහ නැගෙනහිර පළාතේ තෝරාගත් ප්‍රදේශයන්හි වෙසෙන ප්‍රතිලාභීන් 176,000කට සෙත සැළසීමට අපේක්ෂා කෙරේ.

## ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ගැණුම් හිමිකම් මිලියන 14.35 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 22.2)ක් ලබාදීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල එකඟතාවය පලකොට ඇති අතර ඉහත ණය සහයෝගීතාවය ලබා ගැනිමට අදාල මූල්‍ය එකඟතාවය සඳහා ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික අරමුදල අතර 2012 ජනවාරි මාසයේ දී අත්සන් තැබීම සිදු විය.

මෙම ව්‍යාපෘතිය යටතේ ඉරණමඩු ජලාශය පහළ කොටසේ ඇති ප්‍රධාන ඇළ මාර්ගයන්හි කිලෝමීටර් 30ක, අතු හා බෙදුම් ඇළ මාර්ග කිලෝමීටර් 35ක්, ක්ෂේත්‍ර ඇළ මාර්ග කිලෝමීටර් 123ක් සහ ජලපවහන ඇළ මාර්ග කිලෝමීටර් 95ක්, ඇතුළුව වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. මීට අමතරව මෙම ව්‍යාපෘතිය මඟින් කිලිනොච්චිය ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදනය හා අලෙවිය වැඩිදියුණු කිරීමටද බලාපොරොත්තු වේ.

## 2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත ප්‍රධාන ව්‍යාපෘති

2013 වසරේ ක්‍රියාත්මක වීමට නියමිත ප්‍රධාන ව්‍යාපෘති

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | සමාජ ඒකාබද්ධතාවය යුක්තිදාමයට සම ප්‍රවේශත්වය සහ නිතීය බලාත්මක කිරීම ශක්තිමත් කිරීම | 11 |
| | දේශිය ආර්ථික සංවර්ධනය උදෙසා යහපාලනය | 30 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආහාර හා කෘෂිකර්ම සංවිධානය / ලෝක පරිසර වැඩසටහන | සංවර්ධනය වන රටවල වනහරණය හා වනාන්තර ක්ෂය වීම හේතුවෙන් සිදුවන වායු විමෝචනය අවම කිරීම | 4 |
| ලෝක ආහාර වැඩසටහන | කාලගුණික විපර්යාසවල බලපෑම සහ මහවැලි ගංගා ද්‍රෝණිය අවට ජිවත්වන කෘෂි ප්‍රජාවගේ ගැටළු සඳහා විසඳුම් සෙවිම | 7 |

## එක්සත් ජාතීන්ගේ මාර්ගගත ස්වේච්ඡා සේවා

සාමාජික රටවල්වල සංවර්ධන ක්‍රියාවලියට ස්වේච්ඡා සේවකයින් ඒකරාශී කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවක වැඩසටහන උපයෝගී කර ගන්නා උපකරණයන්ගෙන් එකක් වශයෙන් මාර්ගගත ස්වේච්ඡා සේවාව හඳුන්වා දිය හැකිය. මෙමඟින් මෙම සේවාව ලබා ගන්නා සංවිධානවලට ඉතා පුළුල් වූ දැනුම් සම්භාරයක් සහ සම්පත් සපයනු ලබයි. මාර්ගගත ස්වේච්ඡා සේවාව වටිනා කුසලතාවයන් සහ විශේෂඥතාවයන් සපයා දීම පමණක් නොව විවිධ පසුබිම් සහ සංස්කෘතීන් ඔස්සේ නව අදහස් හා නැවුම් දැක්මක් ලබා ගැනීමටද මඟ පෙන්වීමක් සපයනු ලබයි.

## කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD)

1978 වර්ෂයේ සිට, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංවර්ධන පාර්ශ්වකරුවකු ලෙස ක්‍රියාත්මක වී ඇති අතර මේ වන විට ගෘහ ඒකක 550,000කට පමණ සෙත සලසමින් රටේ ග්‍රාමීය ප්‍රදේශයන්හි දරිද්‍රතාවය අඩු කිරීම පිණිස වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 400ක මූල්‍ය දායකත්වයක් මෙතෙක් දක්වා ඇත. ඉහත ව්‍යාපෘති යටතේ මෙම අරමුදල මඟින් හඳුන්වාදෙන ලද ඉතිරි කිරීම් සහ ණය යෝජනා ක්‍රම තුළින් අත්කර ගනු ලැබූ ශක්තිමත් සවිබල ගැන්වීම් දුගී පවුල් කෙරෙහි ඉතා යහපත් බලපෑම් පෙන්නුම් කර ඇත.

**ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති**

| ව්‍යාපෘතිය | මුදල ඇ.ඩො. මිලියන |
|---|---|
| **ණය** | |
| වියළි කලාපීය ජීවනෝපාය සහාය සහ සහභාගීත්වය වැඩසටහන (2005 - 2012) | 23 |
| පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන සහ සම්පත කළමනාකරණ වැඩසටහන (2006-2013) | 24 |
| කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (2007-2014) | 23 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (2010-2015) | 25 |
| ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන වැඩසටහන (2012-2017 | 22 |
| **ප්‍රදාන** | |
| නැගෙනහිර පළාත් සහභාගීත්වය වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපන සහ තිරසාර කළමනාකරණ වැඩසටහන | 7 |

## 2012 වසරේ විශේෂ අවස්ථා

<u>ඔක්තෝබර්</u>

- 2013-2017 කාලපරිච්ඡේදය සඳහා වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුවට ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේදී අත්සන් තැබීම.
- එක්සත් ජාතීන්ගේ සහකාර ලේකම් ජනරාල් අජේව්බර් මහතා ශ්‍රී ලංකාවට පැමිණීම සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන සහයෝගීතා රාමුව අත්සන් කිරීමේ උත්සවයට සහභාගී වීම.

# මානව සම්පත් සංවර්ධන අංශය

මෙම අංශයේ ප්‍රධානතම කාර්යය වන්නේ තාක්ෂණික සහයෝගීතාවය යටතේ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ආධාර ප්‍රදායකයන් විසින් පිරිනමනු ලබන සියලුම විදේශීය පුහුණු අවස්ථා පරිපාලනය කිරීමයි. එයට අමතරව, ඵලදායී තීරණ ගැනීම තුළින් රජයේ සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මෙන්ම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් මහජනතාවට ලබා දීම උදෙසා රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් වන ජාතික කේන්ද්‍රස්ථානය ලෙස මෙම අංශය කටයුතු කරයි.

අංශය මගින් විදේශ පුහුණු අවස්ථා සඳහා සුදුසු අපේක්ෂකයන් හඳුනා ගැනීම සඳහා ආධාර ප්‍රදායකයින් සහ රේඛීය අමාත්‍යාංශ/නියෝජිතායන සමඟ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරයි. මෙම කාර්යය වඩාත් පහසු කිරීම හා කාර්යක්ෂමතාවය වැඩි කිරීම, විනිවිදභාවය සහතික කිරීම හා වගවීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුවන් තෝරා ගැනීම හා විදේශ පුහුණු අවස්ථා සම්බන්ධව දත්ත පාදකයක් පවත්වා ගෙන යනු ලැබේ. සෑම වර්ෂයක් මුලදීම රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනිකුත් ආයතනයන්හි විදේශ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරනු ලැබේ. එමගින් ලබාගත් තොරතුරු දත්ත පාදකයට ඇතුළත් කරන අතර, පසුව ප්‍රදායකයින් විසින් ලබාදෙන පුහුණු අවස්ථා සමඟ ගැලපීම මගින් වඩා සුදුසු අපේක්ෂකයින් හඳුනා ගැනීම සිදු කරනු ලබයි.

තාක්ෂණික ආධාර වැඩසටහන් යටතේ සංවර්ධන පාර්ශ්වකරුවන් 15කට වැඩි ප්‍රමාණයකින් පමණ වාර්ෂිකව දිගුකාලීන (මාස 8 හෝ ඊට වැඩි) හා කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථාවන් 600කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයට ලැබේ. 2012 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ලැබුණු විදේශ පුහුණු අවස්ථා පහත වගුව මගින් දැක්වේ.

## පුහුණු අවස්ථා

| ආධාර ප්‍රදායකයා | පුහුණු අවස්ථා ප්‍රමාණය | |
|---|---|---|
| | දිගු කාලීන | කෙටි කාලීන |
| ආසියානු සංවර්ධන බැංකුව | - | 72 |
| කොළඹ ක්‍රමය | - | 33 |
| තාක්ෂණික සහයෝගීතාවය සඳහා වන පොදු රාජ්‍ය මණ්ඩල අරමුදල | - | 43 |
| ඕස්ට්‍රේලියාව | 18 | - |
| බ්‍රසීලය | - | 5 |
| චීනය | 3 | 81 |
| ජපානය | - | 3 |
| සිංගප්පූරුව | - | 66 |
| මැලේසියාව | - | 8 |
| තායිලන්තය | 6 | 32 |
| කොරියාව | 10 | 146 |
| ඉන්දියාව | - | 64 |
| ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 17 | 137 |
| සාර්ක් මහ ලේකම් කාර්යාලය | - | 9 |
| ලෝක බැංකුව | - | 10 |
| ඉරානය | - | 5 |
| ඉන්දුනීසියාව | - | 7 |
| වෙනත් රටවල් | - | 4 |
| **එකතුව** | **54** | **725** |
| **මුළු එකතුව** | **779** | |

ඒ අනුව, 2012 වර්ෂයේ දී මුළු විදේශීය පුහුණු අවස්ථාවන් 779ක් ශ්‍රී ලංකාවට ලැබී ඇති අතර ඉන් 54ක් දිගු කාලීන පුහුණු අවස්ථාවන් ලෙස ද ඉතිරිය කෙටි කාලීන පුහුණු අවස්ථාවන් ලෙස ද ලැබී ඇත.

විදේශීය පුහුණු අවස්ථාවන්ගෙන් වැඩිම ප්‍රමාණයක් එනම් සියයට 20.15ක් ලබා දී ඇත්තේ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය හරහා ජපාන රජය විසිනි. ජපාන රජය විසින් ලබා දෙන ලද විදේශීය පුහුණු අවස්ථාවන්, කෙටි කාලීන පුහුණු අවස්ථාවන් 140කින් ද දිගු කාලීන පුහුණු අවස්ථාවන් 17කින් ද සමන්විත වී ඇත. කොරියානු රජය විසින් කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය හරහා කෙටි කාලීන පුහුණු අවස්ථාවන් 146ක් ද දිගු කාලීන පුහුණු අවස්ථාවන් 10ක්ද පසුගිය වර්ෂයේ දී මෙරටට ලබා දී ඇත. 2012 වර්ෂයේ දී ලබා දී ඇති මුළු විදේශීය පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 20ක ප්‍රතිශතයක් ඉන් පෙන්නුම් කරයි. චීන මහජන සමූහාණ්ඩුව කෙටි කාලීන පුහුණු අවස්ථාවන් 81ක් ද දිගු කාලීන පුහුණු අවස්ථාවන් 3 (මුළු පුහුණු අවස්ථාවන්ගෙන් සියයට 10.78ක් පමණ)ක් ද පසුගිය වර්ෂයේ දී මෙරටට ලබා දී ඇති අතර ආසියානු සංවර්ධන බැංකුව සහ සිංගප්පූරු රජය විසින් ද 2012 වර්ෂයේදී මෙරටට ලැබුණු මුළු විදේශීය පුහුණු අවස්ථාවන්ගෙන් පිළිවෙලින් සියයට 9ක් සහ සියයට 8ක් වැනි සැලකිය යුතු ප්‍රමාණයක් ලබා දී ඇත.

දිගු කාලීන පුහුණු අවස්ථාවන් පිළිබඳව සැලකීමේදී ශ්‍රී ලංකා රජය වෙත ලැබී ඇති පශ්චාත් උපාධි පුහුණු අවස්ථාවන් මධ්‍යම හා කණිෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවකයන්ට ස්වකීය ඉදිරි වෘත්තීය, විශ්ලේෂණාත්මක සහ තීරණ ගැනීමේ කුසලතවය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ අධ්‍යාපනික හා වෘත්තීය නිපුණතා වැඩිදියුණු කර ගැනීම උදෙසා ලබා දී ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා මධ්‍යම මට්ටමේ රාජ්‍ය සේවකයන්ගේ පවත්නා දැනුම වර්ධනය කිරීම සඳහා මෙන්ම අදාළ ක්ෂේත්‍රයන්හි නිපුණතාවයන් ඉහළ නැංවීම උදෙසා, කෙටි කාලීන පුහුණු අවස්ථා, සම්මන්ත්‍රණ හා වැඩමුළු ලබා දෙනු ලබයි. මෙම පුහුණු අවස්ථා අතරින් වැඩි ප්‍රමාණයක් ලෝකයේ ප්‍රමුඛ පෙළේ පුහුණු ආයතන හා විශ්වවිද්‍යාල මගින් මෙහෙයවනු ලබයි. මෙම පුහුණු අවස්ථාවන් කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වාර්මාර්ග, මාර්ග හා ප්‍රවාහන, සෞඛ්‍ය, ව්‍යවසාය සංවර්ධන, පරිසර, අධ්‍යාපන, රාජ්‍ය පරිපාලනය හා යහපාලනය සහ සංවර්ධන හා රාජ්‍ය ප්‍රතිපත්ති යන ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා ලැබී ඇත.

තනි පුද්ගල පුහුණු වැඩසටහන්වලට අමතරව සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් රාජ්‍ය නිලධාරීන් සඳහා කණ්ඩායම් පුහුණු පාඨමාලාවන්, වැඩමුළු හා අධ්‍යයන චාරිකා ද ප්‍රදානය කරනු ලබයි. ඒ අනුව පහත සඳහන් නිලධාරී කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන් කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් 2012 වර්ෂයේදී ලබා දී ඇත.

## කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ලබා දුන් කණ්ඩායම් පුහුණු පාඨමාලාවන්

- ආර්ථික සංවර්ධන උපායමාර්ග වැඩසටහන සඳහා නිලධාරීන් 22 (2012 ජනවාරි 7 සිට 23 දක්වා)
- දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය පරිපාලනය සඳහා නිලධාරීන් 20 (2012 මැයි 13 සිට 26 දක්වා)
- අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපද්‍රව්‍ය ශක්තිය බවට පරිවර්තනය කිරීම 20 (2012 සැප්තැම්බර් 16 සිට 29 දක්වා)
- ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන සඳහා නිලධාරීන් 20 (2012 සැප්තැම්බර් 2 සිට 15 දක්වා)

## ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ලබා දුන් කණ්ඩායම් පුහුණු පාඨමාලාවන්

- තරුණ නායකයන් සඳහා වන පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 19 (2012 අගෝස්තු 16 සිට සැප්තැම්බර් 14 දක්වා)
- ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පාඨමාලාව සඳහා නිලධාරීන් 6 (2012 ඔක්තොම්බර් 11 සිට නොවැම්බර් 3 දක්වා)

විදේශ පුහුණු අවස්ථාවන් සම්බන්ධව ක්‍රියාත්මක වීමට අමතරව මානව සම්පත් සංවර්ධන අංශය මගින් විදේශීය විශේෂඥයන් හා ස්වේච්ඡා සේවකයන්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා වන වැඩසටහන් ප්‍රදායකයන් හා රේඛීය අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය කරනු ලබයි. රේඛීය අමාත්‍යාංශ මගින් කරනු ලබන ඉල්ලීම් පදනම් කොට ගෙන සුදුසු විශේෂඥයන් හා ස්වේච්ඡා සේවකයන් හඳුනා ගැනීමත් ඔවුන්ව සේවයේ පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීමත් සිදුකරනු ලැබේ. 2012 වර්ෂයේදී ජපානය, කොරියාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සෞඛ්‍ය, සමාජ, ප්‍රජා සංවර්ධන, ක්‍රීඩා, අධ්‍යාපන, භාෂා, ඇඟළුම් හා තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍ර සඳහා පිළිවෙලින් ස්වේච්ඡා සේවකයන් 60, 30 හා 20කගේ සේවය ශ්‍රී ලංකා රජය විසින් ලබා ගන්නා ලදි. 2006 වර්ෂයේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් ඔස්ට්‍රේලියානු රජය විසින් ස්වේච්ඡා සේවකයින් ලබා දීමේ වැඩසටහන නතර කරන ලද නමුත් දශක කිහිපයක සිට ඔස්ට්‍රේලියානු රජයෙන් ද මෙරටට ස්වේච්ඡා සේවකයින් ලබා දී ඇත. මහජනතාව සහ ප්‍රාදේශීය ආයතනයන් හා එක්ව සේවය කිරීමට මෙන්ම ප්‍රාදේශීය ආයතන, ප්‍රජාව සහ ඒ ආශ්‍රිත ජාලයන් ශක්තිමත් කිරීම සඳහා ඔස්ට්‍රේලියානු ස්වේච්ඡා සේවකයින් ලබා දීමට අදාල ගිවිසුමකට ඔස්ට්‍රේලියානු රජය ශ්‍රී ලංකා රජය සමඟ 2012 දෙසැම්බර් මාසයේදී එළඹෙන ලදී.

# ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශය

## ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණ අංශයේ කාර්යභාරය

රජයේ සංවර්ධන වැඩසටහන් මගින් ප්‍රමුඛතා පදනම මත හඳුනා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා නව විදේශ මූල්‍ය ප්‍රභවයන් ආකර්ෂණය කර ගැනීම, නිල සංවර්ධන ආධාර උපයෝජනය හා කළමනාකරණය, විදේශ ආධාර සම්බන්ධීකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම යනාදී කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ. තවද පොදු රාජ්‍ය මණ්ඩල මහලේකම් කාර්යාලය මගින් සපයන ලද ණය සටහන් කිරීමේ හා කළමනාකරණය කිරීමේ පද්ධතිය (CS-DRMS) ඇතුළුව කාර්යක්ෂම හා ඵලදායි තොරතුරු පද්ධතීන් පවත්වාගෙන යාමද මෙම අංශයේ කාර්යභාරයකි.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අංශය මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

- රටේ සංවර්ධනය අරමුණු කරගනිමින් රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සංවර්ධන පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- රේඛීය අමාත්‍යාංශ මගින් සකස් කර මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් ව්‍යාපෘති යෝජනා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් පරිදි සුදුසු ආධාර ආයතනයන් වෙත යොමු කිරීම.
- විදේශ ආධාර මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත නව ව්‍යාපෘති යෝජනා මාලාව පිළියෙල කොට එය යාවත්කාලීන කිරීම හා නිසි පරිදි පවත්වාගෙන යාම.
- විවිධ රේඛීය අමාත්‍යාංශ මගින්, මූල්‍ය යෝජනා සමඟ ඉදිරිපත් කරනු ලබන අනපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම හා ඉහළ බලධාරීන් සමඟ සාකච්ඡා කර මූල්‍ය කොන්දේසි සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබාදීම.
- විදේශ ණය හා ප්‍රදානයන්ගේ එකඟතා ගිවිසුම්, ඊට අදාළ ලැබීම් හා ගෙවීම්, සමස්ත ණය තොගය හා ණය සේවාකරණය යනාදිය පිළිබඳ තොරතුරු කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වා ගැනීම.
- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණය කිරීමේ පද්ධතිය (CS-DRMS) මගින් ගනු ලබන වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ආදී ආයතන වෙත ලබාදීම සිදු කිරීම.
- විදේශ ණය හා ප්‍රදානයන්ට අදාළ විශ්ලේෂණයන් සිදු කිරීම.
- ප්‍රකාශන පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම; විදේශ ආධාර විමසුම, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශනය
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා විදේශාධාර පරිච්ඡේදය සකස් කිරීම.
- රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය වගකීම් පනත අනුව නිකුත් කරනු ලබන මධ්‍ය හා වාර්ෂික වාර්තා සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු සැපයීම.
- විදේශ ආධාර උපයෝජනය සම්බන්ධ අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ නියමිත වේලාවට ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- සංවර්ධන ආධාර කණ්ඩායම් සාකච්ඡා හා විදේශ ආධාර රැස්වීම් සම්බන්ධීකරණය කිරීම
- විදේශ ණය හා විදේශ ආධාර සම්බන්ධ තොරතුරු සහ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා අභ්‍යන්තර ජාලය හා http://www.erd.gov.lk අන්තර්ජාලය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
- දෘඪාංග හා මෘදුකාංග සේවා පවත්වාගෙන යාම සහ පරිශීලක සහාය ලබාදීම
- විදේශ ශිෂ්‍යත්ව පුහුණු සඳහා වූ මෘදුකාංගයේ අධීක්ෂණ හා නඩත්තු කටයුතු කිරීම ඊට සම්බන්ධ වාර්තා අවශ්‍යතාවය මත නිකුත් කිරීම

## 2012 වසරේ කාර්යසාධන

- "සංවර්ධනයෙහිලා ගෝලීය සහයෝගීතාවය 2012" යන වාර්තාව පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- 2011 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ 2011 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව සඳහා "විදේශාධාර" යන පරිච්ඡේදය පිළියෙල කිරීම
- රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව මඟින් මුල්‍ය වගකීම් පහත අනුව නිකුත් කරනු ලබන 2012 වසරට අදාළ මධ්‍ය හා වාර්ෂික වාර්තා සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු සැපයීම
- මාසික මුල්‍ය වාහ රැස්වීම් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම
- ආධාර එකඟතාවයන් සහ උපයෝජනයන් පිළිබඳ විවිධ වාර්තා පිළියෙල කොට ඉහළ අධිකාරීත්වයට හා අනෙකුත් තීරණ ගන්නා ආයතනයන්ට ඉදිරිපත් කිරීම
- රේඛීය අමාත්‍යාංශ මගින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 55ක් අදාළ විදේශ ආධාර ප්‍රදායක අංශ වෙත යොමු කිරීම
- අවබෝධතා ගිවිසුම් 3ක් අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබාදීම
- රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කර ඇති අනපේක්ෂිත ව්‍යාපෘති යෝජනා 20ක් අධ්‍යයනය කිරීම හා අදාල මුල්‍ය ප්‍රභවයන් මඟින් ඉදිරිපත් කර ඇති මුල්‍ය නියමයන් හා කොන්දේසි ඇගයීම. ඒ අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ 07ක් අදාල රේඛීය අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කිරීම
- 2013 වර්ෂයට අදාලව ක්‍රියාත්මකවන නව ව්‍යාපෘති යෝජනා ඇතුළත් විදේශ මුල්‍යයන අයවැය ඇස්තමේන්තුව, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ සමඟ එකතු වී පිළියෙල කිරීම.
- විදේශ ණය ගිවිසුම් 53ක් හා ඒවායේ සංශෝධනවලට අදාළව තොරතුරු හා ගෙවුම් කොන්දේසි දත්ත පාදකයේ සටහන් කරන ලද අතර ඒවායින් 26ක් ණය ගිවිසුම් වන අතර ඉතිරි 27 ප්‍රදාන ගිවිසුම් වේ.
- රු. බිලියන 2,581.8 (හෝ ඇ.ඩො. බිලියන 20.3)ක ණය තොගයක් සඳහා දායකත්වය දරන ණය 717ක් සඳහා ණයසේවාකරණ හා අනෙකුත් ගෙවීම් සඳහා පහසුකම් සැපයීම.
- ණය 188ක් සහ මිලියන 167ක් සඳහා අදාළ වූ ප්‍රතිලබ්ධි සටහන් පවත්වා ගැනීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න 4ක් සඳහා පිළිතුරු සැපයීම.
- නව ණය ගැනීම් 23කට අදාල මුල්‍ය කොන්දේසි විශ්ලේෂණය කිරීම
- 2011 වර්ෂ අවසානයේ දත්ත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සැසඳීම
- විදේශ ආධාර විමසුම 2009 - 2011 අදාළ වගු පිළියෙල කිරීම හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අතර හුවමාරු කර ගැනීම
- නව පරිගණක 16 ක් හා දත්ත ගබඩා කිරීම වෙනුවෙන් වූ මෘදුකාංගය මිලදී ගැනීම.
- නඩත්තු කිරීමේ ගිවිසුම් අලුත් කිරීම
- විදේශ ණය හා ප්‍රදාන සම්බන්ධ තොරතුරු සහ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා අභ්‍යන්තර ජාලය හා http://www.erd.gov.lk අන්තර්ජාලය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
- විදේශ ශිෂ්‍යත්ව පුහුණු සඳහා වූ මෘදුකාංගයේ අධීක්ෂණ හා නඩත්තු කටයුතු කිරීම ඊට සම්බන්ධ වාර්තා අවශ්‍යතාවය මත නිකුත් කිරීම

# මූල්‍ය විග්‍රහය

## වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව රජයට ආදායම් උපයා දෙන දෙපාර්තමේන්තුවක් නොවන නිසා එය මුදල් එක්රැස් කිරීමේ ආයතනයක් ලෙස නොසැලකේ. 2012 වර්ෂයේ අයවැය ශීර්ෂ අංක 239 යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි, ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගිණුම්, පුනරාවර්තන හා වෙනත් වියදම් සඳහා මෙහෙයවීම්වලට අදාළ මූල්‍ය ප්‍රතිපාදන පහත වගුවලින් දැක්වේ.

### පුද්ගල පඩිනඩි සඳහා ප්‍රතිපාදන

| | රු. |
|---|---|
| මුදල් ප්‍රතිපාදන | 39,350,000 |
| **එකතු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන | 0 |
| **අඩු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන | 1,932,800 |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | **37,417,200** |
| වසර තුළ වියදම | 37,330,920 |

### වෙනත් පුනරාවර්තන වියදම්

| | රු. |
|---|---|
| මුදල් ප්‍රතිපාදන | 207,550,000 |
| **එකතු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන | 9,066,927 |
| **අඩු කළා:** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන | 3,210,415 |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | **218,549,727** |
| වසර තුළ වියදම | 138,718,607 |

**ප්‍රාග්ධන වියදම්**

| වැය සංකේතය | වැය විෂයය | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1,000,000 | 181,594 |
| 2003 | වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1,200,000 | 536,867 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | 4,000,000 | 3,784,622 |
| 2202(13) | ප්‍රාග්ධන මාරු කිරීම් ස්වීඩන් උපදේශාත්මක සහයෝගීතාව | 0 | 0 |
| 2204(21) | ආසියානු සංවර්ධන බැංකුව සාමාන්‍ය ප්‍රාග්ධන වර්ධනය | 521,476,000 | 521,475,923 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 500,000 | 195,750 |
| 2401(13) | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 0 | 0 |
| 2502(17) | විදේශ නේවාසික ආයතනවල බදු ප්‍රතිපූරණය කිරීම | 5,000,000 | 3,715,316 |

## අත්තිකාරම් ගිණුම්

රාජ්‍ය සේවකයින්ට ණය දිම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ එක් අත්තිකාරම් ගිණුමක් ඇත. සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුමේ නිශ්චිත සිමාවන් පිළිපැද ඇති අතර එම ගිණුමේ මෙහෙයුම් පහත සඳහන් පරිදි වේ.

| | රු |
|---|---|
| වියදම් කිරීමේ උපරිම සීමාව | 5,000,000 |
| තථ්‍ය වියදම | 4.241,921 |
| ලැබීමේ අවම සීමාව | 2,880,000 |
| තථ්‍ය ලැබීම් | 3,086,126 |
| හර ශේෂයේ උපරිම සීමාව | 32,000,000 |
| තථ්‍ය ශේෂය | 17,788,270 |

## විගණන විමසුම්

2012 වර්ෂය තුළ විගණන විමසුම් 04ක් ලැබී ඇති අතර, සියළුම විමසුම් සඳහා පිළිතුරු යවා ඇත. මෙම විගණන විමසුම් මඟින් විදේශාධාර උපයෝජනය, 2011 වර්ෂයේ විසර්ජන ගිණුම සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විමසුම් කර තිබුණි.

## විසර්ජන ගිණුම

2012 වර්ෂයට අදාළ විසර්ජන ගිණුම 2013 මාර්තු මස 28 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

*ඇමුණුම 1*

## 2012 වර්ෂයේ අත්සන් කරන ලද ව්‍යාපෘති ලේඛනය (ණය)

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත දිනය | පොරොන්දු මුදල | | | මූල්‍ය නියමයන් හා කොන්දේසි | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගිවිසුම්ගත ව්‍යවහාර විනිමයෙන් | | ඇමරිකානු ඩොලර් | පොලී අනුපාත වර්ගය | වාර්ෂික පොලී අනුපාතිකය | | පොරොන්දු ගාස්තු (%) | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (සහන කාලය ඇතුළත්ව) (අවුරුදු) |
| | | | විනිමය වර්ගය | මුදල | | | අනුපාතිකය (%) | ආන්තිකය (100 පදනම් අංක) | | | | |
| **බහුපාර්ශ්වික** | | | | | | | | | | | | |
| **ආසියානු සංවර්ධන බැංකුව** | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) | 2012/11/19 | වි.ගැ.හි | 45,215,000 | 69,684,418 | ස්ථාවර | 1.00 (උපයෝජනය සිදුවන කාල පරාසයේ දී)<br>1.5 (ණය ආපසු ගෙවනු ලබන කාල පරාසයේ දී) | අදාල නොවේ | - | - | 8 | 32 |
| | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) | 2012/11/19 | ඇ.ඩො | 30,000,000 | 30,000,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 0.60 | 0.15 | - | 5 | 26 |
| **ලෝක බැංකුවේ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව** | කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 2012/05/18 | ඇ.ඩො | 213,000,000 | 213,000,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 0.80 | - | මූලික ගාස්තු (0.25%) | 4 | 24 |
| **ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන සමායතනය මූල්‍යනය)** | ඊ ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා (අතිරේක මූල්‍යනය) | 2012/05/01 | වි.ගැ.හි | 7,100,000 | 11,005,824 | ස්ථාවර | 0.75 | අදාල නොවේ | 0.50 | - | 5 | 24 |
| | දැනුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය | 2012/05/18 | වි.ගැ.හි | 64,100,000 | 100,821,980 | | 1.25<br>0.75 (සේවා ගාස්තු) | අදාල නොවේ | 0.75 | - | 5 | 24 |
| **කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල** | ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 2012/01/30 | වි.ගැ.හි | 14,350,000 | 22,032,234 | ස්ථාවර | 0.75 | අදාල නොවේ | - | - | 11 | 25 |
| **අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල** | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය | 2012/10/08 | ඇ.ඩො | 40,000,000 | 40,000,000 | ස්ථාවර | 3.1<br>1.00 (සේවා ගාස්තු) | අදාල නොවේ | - | - | 5 | 20 |

## 2012 වර්ෂයේ අත්සන් කරන ලද ව්‍යාපෘති ලේඛනය (ණය) ඉතිරිය...

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත දිනය | පොරොන්දු මුදල | | | මූල්‍ය නියමයන් හා කොන්දේසි | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගිවිසුම්ගත ව්‍යවහාර විනිමයෙන් | | ඇමරිකානු ඩොලර් | පොලී අනුපාත වර්ගය | වාර්ෂික පොලී අනුපාතිකය | | පොරොන්දු ගාස්තු (%) | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (සහන කාලය ඇතුළත්ව) (අවුරුදු) |
| | | | විනිමය වර්ගය | මුදල | | | අනුපාතිකය (%) | ආන්තිකය (100 පදනම් අංක) | | | | |
| **ද්විපාර්ශ්වික** | | | | | | | | | | | | |
| **චීන සංවර්ධන බැංකු සංස්ථාව** | මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය | 2012/06/28 | ඇ.ඩො | 214,200,000 | 214,200,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 2.90 | - | මූලික ගාස්තු (5.9%) කළමනාකරණ ගාස්තු (0.5%) | 4 | 16 |
| | ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත් විදුලිබල සම්පාදන ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපාංග සඳහා මූල්‍යනය | 2012/01/16 | ඇ.ඩො | 32,496,000 | 32,496,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 3.00 | 0.25 | නිරාවරණ ගාස්තු (5.5%) කළමනාකරණ ගාස්තු (0.25%) | 4 | 15 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය ii අදියර | 2012/09/17 | ඇ.ඩො | 51,000,000 | 51,000,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 4.00 | 0.70 | කළමනාකරණ ගාස්ත (0.9%) | 4 | 15 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය ii අදියර | 2012/09/17 | යුආන් | 1,000,000,000 | 158,358,086 | ස්ථාවර | 2.00 | අදාල නොවේ | 0.50 | කළමනාකරණ ගාස්තු (0.5%) | 6 | 19 |
| | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය ii අදියර | 2012/09/17 | ඇ.ඩො | 600,000,000 | 600,000,000 | ස්ථාවර | 2.00 | අදාල නොවේ | 0.50 | කළමනාකරණ ගාස්තු (0.5%) | 6 | 19 |
| **ප්‍රංශය** | ජාතික මාර්ග ජාලයේ පාලම් 46ක් නැවත ඉදිකිරීම | 2012/11/05 | යුරෝ | 22,050,000 | 28,287,952 | ස්ථාවර | 0.73 | අදාල නොවේ | - | - | 5 | 20 |
| **ජර්මානු සමූහාණ්ඩු ජනරජය** | ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීම | 2012/08/16 | යුරෝ | 28,000,000 | 34,419,001 | ස්ථාවර | 2.20 | අදාල නොවේ | 0.25 | - | 2 | 12 |
| **ඉන්දියාව** | විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 2012/01/17 | ඇ.ඩො | 60,690,000 | 60,690,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 2.00 | 0.50 | අවදානම් වාරිකය (6.5%) කළමනාකරණ ගාස්තු (0.5%) | 3 | 14 |
| | උතුරු දුම්රිය සේවා ප්‍රතිෂ්ඨාපනය කිරීම | 2012/01/17 | ඇ.ඩො | 382,370,000 | 382,370,000 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 0.50 | 0.50 | කළමනාකරණ ගාස්තු (0.5%) | 6 | 20 |

## 2012 වර්ෂයේ අත්සන් කරන ලද ව්‍යාපෘති ලේඛනය (ණය) ඉතිරිය...

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | ගිවිසුම්ගත දිනය | පොරොන්දු මුදල | | | මූල්‍ය නියමයන් හා කොන්දේසි | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ගිවිසුම්ගත ව්‍යවහාර විනිමයෙන් | | ඇමරිකානු ඩොලර් | පොලී අනුපාත වර්ගය | වාර්ෂික පොලී අනුපාතිකය | | පොරොන්දු ගාස්තු | වෙනත් ගාස්තු | සහන කාලය (අවුරුදු) | පරිණත කාලය (සහන කාලය ඇතුළත්ව) (අවුරුදු) |
| | | | විනිමය වර්ගය | මුදල | | | අනුපාතිකය (%) | ආන්තිකය (100 පදනම් අංක) | | | | |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | |
| ජපානය | හබරණ - වේයන්ගොඩ විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය | | | **9,573,000,000** | | | | | | | | |
| | විභේදනය 1 | 2012/03/28 | යෙන් | 9,187,000,000 | 115,329,450 | ස්ථාවර | 0.30 | අදාල නොවේ | 0.10 | - | 10 | 40 |
| | විභේදනය 2 | | | 386,000,000 | | ස්ථාවර | 0.01 | අදාල නොවේ | 0.10 | | | |
| | නැගී එන ප්‍රදේශයන්හි සේවා පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | | | **3,935,000,000** | | | | | | | | |
| | විභේදනය 1 | 2012/03/28 | යෙන් | 3,785,000,000 | 47,406,392 | ස්ථාවර | 0.20 | අදාල නොවේ | 0.10 | - | 10 | 40 |
| | විභේදනය 2 | | | 150,000,000 | | ස්ථාවර | 0.10 | අදාල නොවේ | 0.01 | | | |
| කොරියාව | පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2012/11/02 | කොරියානු වොන් | 12,926,000 | 11,820,850 | ස්ථාවර | 0.15 | අදාල නොවේ | - | - | 11 | 40 |
| නෙදර්ලන්තය | නුවරඑළිය දිස්ත්‍රික් මහරෝහල සංවර්ධනය | 2012/04/05 | යූරෝ | 35,723,788 | 46,989,283 | ස්ථාවර | 4.94 | අදාල නොවේ | - | - | 3 | 12 |
| | හම්බන්තොට දිස්ත්‍රික් මහරෝහල සංවර්ධන කිරීම | 2012/04/05 | යූරෝ | 42,204,783 | 55,514,061 | ස්ථාවර | 4.94 | අදාල නොවේ | - | - | 3 | 12 |
| ස්පාඤ්ඤය | වේයන්ගොඩ දුම්රිය හරස් මාර්ග ගුවන් පාලම ව්‍යාපෘතිය | 2012/06/19 | යූරෝ | 8,554,612 | 10,783,946 | විචල්‍ය | EURIBOR 06 Months | 2.25 | - | කළමනාකරණ ගාස්තු (0.5%) | 2 | 10 |
| | වේයන්ගොඩ දුම්රිය හරස් මාර්ග ගුවන් පාලම ව්‍යාපෘතිය | 2012/06/19 | යූරෝ | 2,668,565 | 3,363,993 | විචල්‍ය | EURIBOR 06 Months | 2.75 | - | කළමනාකරණ ගාස්තු (0.5%) | 1 | 3 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල | මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය | 2012/10/30 | රියාද් | 225,000,000 | 59,924,547 | ස්ථාවර | 2.00 | අදාල නොවේ | - | - | 5 | 20 |
| එක්සත් රාජධානිය | ස්ථිර ග්‍රාමීය යකඩ පාලම් 210ක් ඉදිකිරීම | 2012/06/24 | ඇ.ඩො | 44,142,909 | 44,142,909 | විචල්‍ය | LIBOR 06 Months for US$ | 2.00 | - | - | 5 | 15 |
| | | | | **එකතුව** | **2,443,640,926** | | | | | | | |

**සටහන :** රාජ්‍ය ව්‍යාපාර සඳහා ලබාගත් ණය ඇතුළත් නොවේ

*ඇමුණුම 2*

## 2012 වර්ෂයේ අත්සන් කරන ලද ව්‍යාපෘති ලේඛනය (ප්‍රදාන)

| සංවර්ධන පාර්ශ්වකරු | | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ප්‍රදාන ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ගිවිසුම් අත්සන් කරන ලද විනිමයෙන් | | රුපියල් | ඇ.ඩො මිලියන |
| | | | | විනිමය | ප්‍රමාණය | | |
| ද්විපාර්ශ්වීය | කොරියාව | 2012/12/21 | ශ්‍රී ලංකාවේ කාර්මික හා තාක්ෂණික විද්‍යාල වල මෝටර් රථ තාක්ෂණ මධ්‍යස්ථාන නවීකරණය කිරීම හා තත්ත්වය ඉහළ නැංවීම | ඇ.ඩො | 3,000,000 | 383,659,500 | 3,000,000 |
| | | 2012/12/21 | ශ්‍රී ලංකාවේ නිල්වලා ගංගා දෝණියේ දිගිලි ඔය බහුකාර්ය ජලාශය සඳහා ශක්‍යතා අධ්‍යයනය හා සවිස්තර සැලැස්ම | ඇ.ඩො | 2,500,000 | 319,716,250 | 2,500,000 |
| | | 2012/12/21 | ප්‍රදේශයේ උසස් රථ වාහන ගමනාගමන කළමනාකරණ පද්ධතිය උදෙසා තාක්ෂණික සහය | ඇ.ඩො | 2,500,000 | 319,716,250 | 2,500,000 |
| | ඉන්දියාව | 2012/01/17 | උතුරු, නැගෙනහිර, මධ්‍යම හා ඌව පළාතේ නිවාස ඒකක 49,000ක් සඳහා ප්‍රදාන | ඉන්දියානු රුපියල් | 13,190,000,000 | 29,304,223,000 | 257,283,209 |
| | ජපානය | 2012/03/06 | කිළිනොච්චි ජලසම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම | යෙන් | 677,000,000 | 1,014,349,100 | 8,318,244 |
| | | 2012/03/06 | කැළණිය විශ්වවිද්‍යාලයේ හා සබරගමුව විශ්වවිද්‍යාලයේ ජපන් භාෂා ඉගෙනීමේ පහසුකම් වැඩිදියුණු කිරීම | යෙන් | 48,400,000 | 72,517,720 | 594,687 |
| | | 2012/03/06 | කාර්මික නිෂ්පාදන සැපයීම | යෙන් | 300,000,000 | 449,490,000 | 3,686,076 |
| | | 2012/05/25 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය | යෙන් | 211,000,000 | 344,162,100 | 2,646,595 |
| | ජර්මනිය | 2012/01/31 | ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වෘත්තීය පුහුණු ආයතනය | යුරෝ | 4,000,000 | 599,979,600 | 5,267,600 |
| | චීනය | 2012/05/04 | යාපනය, කිලිනොච්චි හා මුලතිව් හි තරුණයින් වෙනුවෙන් ක්‍රීඩා භාණ්ඩ ලබාදීම | යුආන් | 1,000,000 | 20,291,900 | 158,628 |
| | ඇමරිකා එක්සත් ජනපදය | 2012/09/27 | සමාජ ඒකාබද්ධතාවය සඳහා සහයෝගීතාව ශක්තිමත් කිරීම | ඇ.ඩො | 1,400,000 | 183,354,780 | 1,400,000 |
| | | 2012/09/27 | සාධාරණාත්මක ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීම | ඇ.ඩො | 3,700,000 | 484,580,490 | 3,700,000 |
| | | 2012/04/05 | කිලිනොච්චි සහ මුලතිව්හි වාරි හා කෘෂිකාර්මික ජීවනෝපාය සංවර්ධනය | යුරෝ | 3,330,000 | 549,563,886 | 4,380,115 |
| බහුපාර්ශ්වීය | ලෝක බැංකුව | 2012/11/20 | කොළඹ අගනගර, නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩො | 900,000 | 117,124,110 | 900,000 |
| | | 2012/03/22 | ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය ශක්තිමත් කිරීම [ICASL] | ඇ.ඩො | 500,000 | 65,205,950 | 500,000 |

# 2012 වර්ෂයේ අත්සන් කරන ලද ව්‍යාපෘති ලේඛනය (ප්‍රදාන) ඉතිරිය...

| සංවර්ධන පාර්ශ්වකරු | | ගිවිසුම්ගත දිනය | ව්‍යාපෘතිය | ප්‍රදාන ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ගිවිසුම් අත්සන් කරන ලද විනිමයෙන් | | රුපියල් | ඇ.ඩො මිලියන |
| | | | | විනිමය | ප්‍රමාණය | | |
| බහුපාර්ශ්වීය | ලෝක බැංකුව | 2012/07/17 | ලෝක ආහාර අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන | ඇ.ඩො | 6,500,000 | 869,602,500 | 6,500,000 |
| | | 2012/11/30 | 'දිරි සවිය' මුදල් ලබාදීම් හා පුහුණුවීම් හරහා ආබාධිතයින්හට සහායවීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො | 2,590,000 | 337,349,313 | 2,590,000 |
| | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 2012/06/25 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම - අදියර (11)- අතිරේක මූල්‍යයන | ඇ.ඩො | 13,425 | 1,783,749 | 13,425 |
| | | 2012/06/25 | දකුණු - දකුණු සහයෝගීතාවය තුළින් හැකියා ගොඩනැංවීම - අතිරේක මූල්‍යයන | ඇ.ඩො | 44,000 | 5,846,135 | 44,000 |
| | | 2012/06/25 | පළාත් පාලන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයන | ඇ.ඩො | 3,221,567 | 428,038,976 | 3,221,567 |
| | | 2012/07/10 | ශ්‍රී ලංකා ප්‍රජා වන වැඩසටහන | ඇ.ඩො | 4,792,988 | 639,722,026 | 4,792,988 |
| | | 2012/12/04 | ආපදා අවදානම් කළමනාකරණ ගමන්මඟ ක්‍රියාවට නැංවීම | ඇ.ඩො | 2,150,000 | 278,483,480 | 2,150,000 |
| | සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් | 2012/03/01 | ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාව නැවත පැමිණීම හා යළි ඒකාබද්ධ කිරීම වෙනුවෙන් සහාය | රුපියල් | 5,690,000 | 5,690,000 | 46,675 |
| | | 2012/10/05 | ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාව නැවත පැමිණීම හා යළි ඒකාබද්ධ කිරීම වෙනුවෙන් සහාය | රුපියල් | 11,000,000 | 11,000,000 | 84,810 |
| | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | 2012/06/15 | UNICEF දේශීය වැඩසටහන 2008 - 2012 | ඇ.ඩො | 26,000,000 | 3,433,401,400 | 26,000,000 |
| | ලෝක ආහාර වැඩසටහන | 2012/08/21 | ශ්‍රී ලංකා සුරක්ෂිත සහන හා ප්‍රතිස්ථාපන (ප්‍රකෘතිකරණ) | ඇ.ඩො | 27,960,762 | 3,696,703,528 | 27,960,762 |
| | | | | | මුළු එකතුව | **43,974,768,300** | **370,546,379** |